IslamHouse.com

# ඉස්ලාම් පිළිබඳව ඇති ප්‍රශ්න හා පැහැදිලි කිරීම්

## මුහම්මද් මන්සූර් දහ්ලාන්

විශ්ව විද්‍යාවලයේ

අධ්‍යා◌ාපනික කටයුතු කිරීමේදී

කණ්ඩායම් ක්‍රි යාකාරිත්වයන්

සිදු කිරීම අත්‍යාවශ්‍යා වේ.

ඉස්ලාමීය නීතියට අනුව

ඉස්ලාමීය ගැහැනු ළමයෙකු

ඉස්ලාමීය නොවන පිරිමි ළමුන්

සමග සමීප සම්බන්ධතා

පැවැත්වීම තහනම් ය. මෙවන් අවස්ථාවන්හි ක්රි යා කළ යුතු ක්රහමය පහදන්න.

https://islamhouse.com/461115

- ඉස්ලාම් පිළිබඳව ඇති ප්‍රශ්න හා පැහැදිලි කිරීම්
    - ඉස්ලාම් පිළිබඳව ඇති ප්‍රශ්න හා පැහැදිලි කිරීම් – 1.
    - ඉස්ලාම් පිළිබඳ ප්‍රශ්න හා පැහැදිලි කිරීම් – 2.
    - ඉස්ලාම් පිළිබඳ ප්‍රශ්න සහ පැහැදිලි කිරීම් – 3.

- ඉස්ලාම් පිළිබඳ ප්‍රශ්න සහ පැහැදිලි කිරීම් – 4.

# ඉස්ලාම් පිළිබඳව ඇති ප්‍රශ්න හා පැහැදිලි කිරීම්

මුහම්මද් මන්සූර් දහ්ලාන්

# ඉස්ලාම් පිළිබඳව ඇති ප්‍රශ්න හා පැහැදිලි කිරීම් – 1.

මුහම්මද් මන්සූර් දහ්ලාන්

1. ප්‍රශ්නය:

විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනික කටයුතු කිරීමේදී කණ්ඩායම් ක්‍රියාකාරිත්වයන් සිදු කිරීම අත්‍යාවශ්‍ය වේ. ඉස්ලාමීය

නීතියට අනුව ඉස්ලාමීය ගැහැනු ළමයෙකු ඉස්ලාමීය නොවන පිරිමි ළමුන් සමග සමීප සම්බන්ධතා පැවැත්වීම තහනම් ය. මෙවන් අවස්ථාවන්හි ක්‍රියා කළ යුතු ක්‍රමය පහදන්න.

පැහැදිලි කිරීම:

ඉහත මතය අනුව ඉදිරිපත් කොට ඇත්තේ මුස්ලිම් ගැහැනු ළමයෙකුට මුස්ලිම් නොවන පිරිමි ළමුන් සමග සමීප සම්බන්ධතා පැවැත්වීම තහනම් බවය. මෙය නිරවද්‍ය ප්‍රකාශනයක් නොවේ. මුස්ලිම්

ගැහැනු ළමයෙකුට මුස්ලිම් පිරිමි ළමයෙකු සමග වුවද සමීප සම්බන්ධතා පැවැත්වීමේ පිළිවෙතෙ හි සීමාවක් තිබේ. මුස්ලිම් හෝ මුස්ලිම් නොවන සාධකය මත පිහිටන්නේ නැතිව එකසේ සැමට එම පිළිවෙත වලංගුය. මෙවැනි පිළිවෙතක් ඇත්තේ කුමන හේතුන් නිසාද? අද ගැහැනු ළමයෙකු හෙට දවසේ මාතෘත්වයේ උදාර ගෞරවයට උරුමකම් කියන්නියකි. මාතෘත්වයේ උදාර ගෞරවයට උරුමකම් කියන්නට නම් ඇයගේ චරිතය නොකැළැල් හා

පිරිසිදු එකක් විය යුතු වෙයි. මෙය පිරිමි දරුවන්ට ද එක සේ අදාළ පිළිවෙතකි. පූර්ව විවාහ ලිංගික ක්‍රියාකාරකම් මගින් වඩාත් අසීරුතාවන්ට පත් වන්නේ පිරිමි දරුවන්ට වඩා ගැහැනු දරුවන්ය. සිතේ හැඟීම් වලට වහල් වන්නට තරම් අප බොළඳ නැතැයි යමෙකු පවසන්නට ඉඩ ඇත. නමුත් ලෝක යථාර්ථය හා මනුෂ්‍යයාගේ ස්වාභාවිකත්වය පිළිබඳ මනා අවබෝධයෙන් සමාජ සදාචාරය ආරක්ෂා කිරීමේ අරමුණින් ඉස්ලාමය මෙවන් සීමාවන් පනවා ඇත්තේ

සැමගේ යහපත පිණිසය. විනාශයක් ඇති කර ගෙන මුළු ජීවිත කාලයම දුකින් ගත කරනවාට වඩා විනාශයේ මං අහුරා මනුෂ්‍ය වර්ගයාට යහපත් හා සතුට සපිරි ජීවිතයකට මග පෙන්වීම ඉස්ලාමයේ පිළිවෙතයි. මේ පිළිබඳව ඇති විද්‍යාත්මක තොරතුරු දෙසද අපගේ අවධානය යොමු කරමු.

ලිංගික උත්තේජනය පිළිබඳව ඇති විද්‍යාත්මක විග්‍රහය දෙස බලමු.

# ලිංගික උත්තේජනය පිළිබඳ විද්‍යාත්මක මතය

මිනිසා බඳු විෂම ලිංගික (hetero sexual) සත්වයින් තුළ ලිංගික හැඟීම් ඇති වන්නේ එක්තරා අන්තරාසර්ග ග්‍රන්ථියකින් වහනය වන හෝර්මෝන වර්ගයක් නිසා බව පර්යේෂණාත්මක මනෝ විද්‍යාවෙන් හා ජීව රසායන විද්‍යාවෙන් පෙන්වා දී තිබේ. අධිලිංගික හෝ අවලිංගිකතාව මේ ග්‍රන්ථි වල අධික්‍රියාකාරිත්වය හෝ අවක්‍රියාකාරිත්වය මත කෙළින්ම රඳා පවතී. ප්‍රති

විරුද්ධ ලිංගිකයන්ගේ දර්ශනය, ගන්ධය, ස්පර්ශය, ශබ්දය ආදී ඉන්ද්‍රිය ග්‍රහණ නිසා හෝ ඒ සම්බන්ධ වෙනත් දෙයක් නිසා හෝ සිතේ ලිංගික හැඟීම් පිබිදෙයි. මෙහි ප්‍රතිඵලය ලෙස චාලක ස්නායු ඔස්සේ ලිංගික ග්‍රන්ථි කරා විද්‍යුත් ආවේග ගමන් කරයි. එවිට එම ග්‍රන්ථි වලින් රුධිරයට හෝර්මෝන වහනය වෙයි. රුධිර සංසරණය මගින් මොළය දක්වා එන මෙම හෝර්මෝන පුද්ගලයාගේ සිතුවිලි තවත් පුබුදු කරයි. ජීව විද්‍යාත්මක සාධකයක් වන මෙම චිත්තවේග මර්දනය

කිරීම මිනිසාට ඉතාමත්ම දුෂ්කර කාර්යයකි. මේ හේතුවෙන් ඔහුට සියලු සදාචාර නීති අමතක වෙයි.

නූතන මනෝ විද්‍යාව අපට උගන්වන්නේ පුරුෂයින්ට හා ස්ත්‍රීන්ට ලිංගික උත්තේජනය සිදු වන ආකාරයේ වෙනසක් ඇති බවය. අඩ නිරුවතින් සැරසුණු පිරිමියෙකු දැකීමෙන් ස්ත්‍රියකගේ මනසේ ලිංගික පිබිදීමක් ඇති වන්නේ ඉතාමත්ම අල්ප වශයෙන් බවත් ස්පර්ශය තුළින් ඇගේ හැඟීම් අවදිවීම ඉතා අධිකව සිදු වන්නක් බවත් මනෝ විද්‍යා

සොයා ගැනීමෙන් තොරව වුවත් අප අත්දකිනා සත්‍ය කරුණකි. අනෙක් අතින් අඩනිරුවතින් සැරසුණු ස්ත්‍රියකගේ ශරීරය දැකීමෙන් පිරිමියෙකුගේ සිත තුළ ඇති වන රාගික හැඟීම් ඉතාමත්ම අධික බවත් අප දන්නා සත්‍යයකි.

ඇඳුම සංස්කෘතියෙන් සංස්කෘතියට වෙනස් විය හැකිය යන්න සත්‍යයකි. කිතුනු මව් තුමියකගේ හෝ භික්ෂුණියකගේ හෝ ඇඳුම එක හා සමාන නොවිය හැක. නමුත් මෙම ඇඳුම් දෙකම සදාචාර

සම්පන්න යැයි පැවසීම ඉතාමත් නිවැරදිය. අප මෙම ඇඳුම් සදාචාර සම්පන්න යැයි පවසන්නේ ඇයි? පිරිමියෙකුට මෙම දෙදෙනා දෙස බලන්නට සිදු වුවහොත් ඔහුගේ සිතේ ඇති වන්නේ කුමන ආකාරයේ හැඟීම්ද? සත්‍ය වශයෙන්ම ලිංගික හැඟීම් ඇති වීමට ඉඩක් තිබේද? දෙදෙනාම ස්ත්‍රීන්. නමුත් මෙම ස්ත්‍රීන් දෙදෙනා දෙස බලා තම සිතේ ලිංගික උත්තේජනයක් ඇති නොවීමට ප්‍රධාන හේතුව කුමක්ද? තම හෘදසාක්ෂියට එකඟ ව පැවසිය හැකි එකම සත්‍යය වන්නේ

ඔවුන්ගේ සිරුරු වැසෙන පරිදි ගෞරවනීය ලෙස ඇඳ ඇති "ඇඳුම" බව නොවේද? එසේ නම් තමන්ගේ මව, බිරිය, දියණිය, සහෝදරිය හෝ ඕනෑම ස්ත්‍රියක් මහමග අන් පිරිමින්ගේ සිත් අනවශ්‍ය ලෙසට නොසන්සුන් නොකොට හා එම අයගේ සිත් තුළ ලිංගික හැඟීම් ඇති නොකොට සිටින්නට නම් ඔවුන්ගේ ඇඳුම් සංවර විය යුතු බව අප පිළි ගත යුතු නොවන්නේද?

කිතුනු මව් තුමිය ඇගේ මුහුණ, දෑතේ මැණික් කටුවෙන් (wrist) පහත අත්ල හා දෙපයේ

වළලුකරින් (ankle) පහත පාද කොටස යන ශරීර පෙදෙස් හැර මුළු ශරීරයම වැසෙන පරිදි ඇඳුම් ඇඳ ඇති ආකාරය දකින පිරිමියෙකුගේ මනසේ ඇය පිළිබඳව ඇති වන්නේ ගෞරවයක් යන්න අමුතුවෙන් කිව යුතු නොවේ. ඇගේ පාද ද පාවහන් වලින් හා බොහෝ විට මේස් වලින් ආවරණය වී ඇත. මෙහෙණීන් වහන්සේගේ ඇඳුම ද මෙයටම සමාන සංවරතාවකින් යුක්ත වන්නකි. එකම වෙනස වන්නේ භික්ෂුණියකට හිස වසා ගැනීමේ අවශ්‍යතාවක් මතු

නොවන්නේ එය සම්පූර්ණයෙන්ම මුඩුගා ඇති හෙයිනි. මෙසේ නොවී තිබුණේ නම් කිතුනු මව් තුමිය මෙන්ම මෙහෙණින් වහන්සේ නමක් වුවද දකින පිරිමියෙකුට ගෞරවය වෙනුවට ඇති විය හැක්කේ කුමන ආකාරයේ චෛතසික හැඟීම් ද යන්න ගැන අමුතුවෙන් අටුවා ලිවීමේ අවශ්‍යතාවක් නොමැත. මව, දියණිය, සහෝදරිය, බිරිය යනාදී ගෞරවනීය මිනිස් බැඳියාවන්ට උරුමකම් පෑමට හැකියාව ඇත්තේ කාන්තාවකට පමණි. ඇයව

වෙළඳ භාණ්ඩයක් බවට පත් කොට ලිංගික සන්තර්පණයේ මාර්ගයක් පමණක් බවට පත් කළ විට සිදු විය හැකි සමාජ ව්‍යසනය පිළිබඳව අපගේ අවධානය යොමු කළ යුතු නොවන්නේද? අද සිදු වී හෝ සිදුවෙමින් පවතින්නේ කුමක්ද? ස්ත්‍රිය අද නිරුවතින් ඇඳුම් අඳින විට ආගමික නායකයින් ඇතුළු සමාජයේ බහුතරය මුනිවත රකිති. මෙම භයානක නිහැඬියාව අපට හඬ නගා පවසන්නේ කුමක්ද? මුළු මහත් සමාජ ව්‍යුහයම සදාචාර සෝදාපාළුවකට ලක් වී ඇති

බව නොවේද? රණස්ගල්ලේ හිමියන් රචිත 'ලෝකෝපකාරයෙහි' එන "ඔවා දෙනු පරහට තමා සම්මතයෙහි පිහිටා සිට" යන වදනට අනුව වර්තමාන සමාජ නායකත්වය අන් අයට යහ ඔවදන් නොදී, ඔවුන්ව සදාචාරයේ මගට නොකැඳවා සිටින්නේ තමා සම්මතයේ නොමැති නිසාද කියා අසන්නට අපට සිදුවෙනවා නොවේද?

වඩාත් අදහාගත නොහැකි කරුණ බවට පත් වී ඇත්තේ ස්ත්‍රියක් තමන්ගේ සංස්කෘතිය අනුව සදාචාර සම්පන්න ලෙස

ඇඳුමින් සැරසී සමාජගත වන විට මතු කරන්නා වූ අවලාදයන් ගැනය. මෙවන් සදාචාර විරෝධී හැඩ දහමක නමින් එන විට මුළු සමාජයම පත් වන්නේ කුමන තත්වයකටද? අසංවරකම ප්‍රගුණ කරන්නට දරන්නා වූ වෑයමක් ලෙස මෙය හඳුන්වාදිය නොහැකිද? දරුවන් ඇති යහ දෙමව්පියන් මේ පිළිබඳව දක්වන ප්‍රතිචාරය කුමක්ද? කාගේ හෝ සැඟවුණු න්‍යාය පත්‍රයකට අනුව හෝ තවත් ශ්‍රී ලාංකේය ජනවාර්ගික කොටසක් කෙරෙහි ඇති තමන්ගේ පදනම් විරහිත

වෛරය නිසා හෝ යහ චින්තනයකින් තොරව සමාජ සදාචාරය පිරිහීමට දිරි දෙන අයුරින් කටයුතු නොකළ යුතු යැයි ඉතා නිහතමානීව අපි ඉල්ලා සිටින්නෙමු. නූතන වාණිජ සමාජය විසින් ස්ත්‍රීයව වෙළෙඳ භාණ්ඩයක් බවට පත් කර තිබීම ගැන කිසිම හඬක් ඇසෙන්නේ නැත. ශරීරයෙන් 5% ක් පමණ වසා ගත් තරුණියන්ගේ රාගය දනවන රූප රාමු වෙළෙඳ දැන්වීම් වලට යොදා ගැනීම ගැන දහම් ගැන කථා කරන්නන් මුනිවත රකිමින් රහසිගත වින්දනයක

යෙදී සිටින්නේදැයි අසන්නට තරම් කාරණයක් බවට පත් වී ඇත. කසාය බිව් ගොළුවා සේ මෙම උදවිය කටයුතු කරන්නේ මන්ද? මෙවන් රූප රාමු වලට තම මව, බිරිය, සහෝදරිය හෝ දියණිය ඉදිරිපත් කරන්නට අපි අකැමැති වන්නෙමු. අවාසනාවට, පිටස්තර ස්ත්‍රීන්ගේ කාමුක දර්ශන දෙස බලා මානසික වශයෙන් රෝගී වින්දනයක් ලබා ගන්නට සමහරුන් හුරු වී ඇති අතර මෙම රෝගයේම කොටසක් ලෙසින් තම ශරීරය සදාචාර සම්පන්න ලෙස වසා ගන්නා වූ

ස්ත්‍රීන්ට අවලාද නගන්නට ද හුරු වී සිටිත්. සාරධර්ම හා සදාචාරයෙන් යුත් සමාජයක් ගොඩ නැගීම සඳහා වූ ඉස්ලාමීය ඉගැන්වීම් ගැන විරුද්ධත්වය පාමින් ඊනියා ස්ත්‍රී අයිතිවාසිකම් ගැන කතා කරන්නන්ගේ සැඟවුණු අරමුණු කුමක්ද යන්න දැන් පැහැදිලි වී ඇතැයි සිතන්නෙමු.

සත්ව ලෝකයේ ඇඳුම් අඳින්නේ මිනිසා පමණි. මිනිසා සහ සත්ව ලෝකයේ අනිකුත් සතුන් අතර ඇති වෙනස්කම් අතුරින් ප්‍රධාන එක් වෙනස්කමක් ලෙස මෙය සැලකිය හැකිය. අප

පමණක් මෙසේ කරන්නේ ඇයිද
යන ප්‍රශ්නයට ලැබිය හැකි
නිවැරදිම පිළිතුර වන්නේ
මිනිසාට පමණක් උරුම වූ
ලැජ්ජ බය මත පදනම් වූ
සදාචාරය යැයි පැවසීම
ඉතාමත් නිවැරදිය. එම නිසා
ඇඳුම යනු සදාචාරය හා බැඳුණු
ක්‍රියාවක් ලෙස අපට ඔප්පු වන
ක්‍රියාවකි. සදාචාරය හා බැඳීමක්
නොමැත්තෙකුට ඇඳුම් පිළිබඳ
ගැටලුවක් බොහෝ විට
නොමැති අතර ඇඳුමේ ප්‍රමාණය
අඩු වෙන තරමට හෝ ඇඳුම්
නොමැතිවීම හෝ හොඳ යැයි
සිතීමට ඉඩ ඇත. අප යහ

මිනිසුන් යැයි හඳුන්වන්නේ සදාචාර සම්පන්න වුවන්ට යැයි පැවසීම ලොව ඕනෑම සමාජයක් පිළිගන්නා වූ යථාර්ථයකි. සදාචාරය සෑම දහමකම මූලික පදනම ලෙස සැලකෙන්නේ එහෙයිනි.

පිරිමියෙකුට තම පෙකණියේ සිට දණහිස වැසෙන පරිදි ඇඳුමක් ඇඳීම සදාචාර විරෝධී ක්‍රියාවක් ලෙස කිසිවෙක් දකීවියි අපි නොසිතන්නෙමු. නමුත් එම ඇඳුම ස්ත්‍රියකට කෙසේ නම් සුදුසු විය හැකිද? පෙකණියේ සිට දණහිස දක්වා ඇඳුමක් ඇඳ ගත් පිරිමියෙකු තම ගෙවත්තේ

වැඩ කරන විට එය අසලින් යන පිටස්තර ස්ත්‍රීන්ට ඔහු ලිංගික ආකර්ෂණයක් නොවන බව අපි ඉතාම හොඳින් දනිමු. නමුත් එම ඇඳුමම ඇඳ ස්ත්‍රියක් එම කාර්යයේම නියැළුනහොත් සිදු විය හැකි කලබැගෑනිය පිළිබඳව අමුතුවෙන් කිව යුතු වන්නේද? මෙයින් පෙනෙන්නේ ස්ත්‍රී පිරිමි දෙකොටසේම ඇඳුම් සම විය නොහැකි බව නොවේද?

මෙම සියලු කරුණු සැලකිල්ලට ගෙන ‘මහ්රම්’ යන ඉස්ලාමීය සංකල්පයට අන්තර්ගත නොවන කිසිම ස්ත්‍රියක් සමග

තනිව සිටීමට කිසිම පිරිමියෙකුට අනුමැතියක් ඉස්ලාමීය සදාචාර පිළිවෙතෙහි නොමැත. ‘මහ්රම්’ යනු තමාට ඉස්ලාමීය නීතිය අනුව ස්ථිර ලෙස විවාහ වීමට අනුමැතියක් නොමැති  ස්ත්‍රීන්ය. තම බිරිය ගේ සොයුරියව බිරිය ජීවත් වන තාක් කල් හෝ දික්කසාද මගින් ඇගෙන් වෙන්වීමක් සිදු වන තෙක් විවාහ වීමට අනුමැතියක් නොමැති ස්ත්‍රියකි. එහෙයින් බිරියගේ සොයුරිය ස්ථිර ලෙස විවාහ වීමට තහනම් කණ්ඩායමට ඇතුළත් වන්නේ නැත. එහෙයින් ඇය ‘මහ්රම්’

සංකල්පයට අන්තර්ගත නොවන හෙයින් ඇය සමග තනියෙන් සිටීමට හෝ දුර බැහැර ගමන් යෑමට  අනුමැතියක් නොමැත. තම මව, දියණිය, සොයුරිය, මවගේ සොයුරිය වැනි අය ලේ බැඳියාවකින් තමන්ට විවාහ වීමට ස්ථිර ලෙස තහනම් ස්ත්‍රීන් කණ්ඩායමට ඇතුළත් වෙති. ඔවුන් සමග සමීපතාව, දුර බැහැර ගමන් යෑම ආදිය ඉස්ලාමීය නීතිය අනුව අනුමතය.

විශ්ව විද්‍යාල පරිශ්‍රයේ තම අධ්‍යයන කටයුතු වලට පමණක්

සීමා කරමින් ඉහත කරුණු සියල්ල සැලකිල්ලට ගෙන ඉස්ලාමීය ඇඳුම හා සංවරය සුරකිමින් කණ්ඩායම් ලෙස එකට කටයුතු කිරීම ඉස්ලාම් නීතියට පටහැණි ක්‍රියාවක් නොවන බව සිතමි. අල්ලාහ් සර්ව ඥානීය, සියල්ල දන්නාය.

## ඉස්ලාම් පිළිබඳ ප්‍රශ්න හා පැහැදිලි කිරීම් – 2.

ප්‍රශ්නය

ඉස්ලාමය ජ්‍යෝතිෂය ප්‍රතික්ෂේප කරන්නේද? එසේ

නම් එයට හේතු පැහැදිලි කරන්න.

පැහැදිලි කිරීම

ලග්න පලාපල කේන්දර බැලීම අත්ලේ රේඛා ශාස්ත්‍රය සුබ අසුබ වේලාවන් සුබ අසුබ සලකුණු නැකත් හා හුනු ශාස්ත්‍රය වැනි ක්‍රියාවන් මගින් පොදුවේ අපේක්ෂා කරන්නේ සිදු වීමට ඇති දෑ පිළිබඳ අනාවැකි ප්‍රකාශ කිරීමයි. මෙම කරුණු සියල්ලම ජ්‍යෝතිෂය විෂය ධාරාවට අදාළ කරුණු ලෙස සැලකිය හැක. ශබ්දකෝෂ අර්ථ දැක්වීමට අනුව ජ්‍යෝතිර්

වේදය හෙවත් ජ්‍යෝතිෂය අර්ථ දක්වා ඇත්තේ “නක්ෂත්‍ර තාරකාදීන්ගේ ගමන් හා සාපේක්ෂ පිහිටීම ආදිය මිනිසාට මිනිස් කටයුතු වලට හා පරිසරයට ඇතැයි කියන බලපෑම් පිළිබඳ ව උගන්වන විද්‍යාව, නැතහොත් විද්‍යාව”, ආදී වශයෙනි.

මිනිසා නිරතුරුවම අනාගතය පිළිබඳව බලාපොරොත්තු හා සැකය පදනම් කර ගනිමින් කටයුතු කරන්නෙකි. සිදු වීමට ඇති දෑ පිළිබඳ කුතුහලය හේතුවෙන් මෙවන් අනාවැකි ක්‍රමවේද උපයෝගී කරගන්නට

ඉදිරිපත් වෙයි. මෙම ක්‍රමවේදයන් කොතෙක් දුරට සත්‍යය හා විද්‍යාත්මක පදනමකින් යුක්තද යන්න පළමුව විමසා බලා පසුව ඉස්ලාමයේ ස්ථාවරය පිළිබඳව සාකච්ඡා කරන්නට අපේක්ෂා කරන්නෙමු.

අප රටෙ හි පළ වන ‘ජාතික’ පුවත්පත් මෙන්ම රූපවාහිනි හා ගුවන් විදුලි නාලිකා මගින් ද මෙවන් ක්‍රියාවන් සඳහා පිටු ගණන් හා විකාශන වේලාවන් වෙන් කර ඇති අතර ජනගහණයෙන් ප්‍රමාණවත් පිරිසක් මේ පිළිබඳව උනන්දුවක්

දක්වන බවද දක්නට ඇත. විවාහ යෝජනා දැන්වීම් සියල්ලෙහිම පාහේ මෙම කරුණු අන්තර්ගතව ඇති බව දක්නට ඇත. මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යයන් මෙලෙස ජ්‍යෝතිෂයට දී ඇති වැදගත්කමින්ම අප සමාජය කෙතරම් දුරට මෙම ක්‍රියාවලිය කෙරෙහි තබා ඇති විශ්වාසය මැන ගත හැකි වනු ඇතැයි සිතන්නෙමු. නමුත් මේවායින් කෙරෙනු ලබන බලපෑම පිළිබඳව විද්‍යාත්මකව හා යථාර්ථවාදීව විචාරය කරන හා අභියෝග කරන අවස්ථා අප

දැක ඇත්තේ ඉතා විරලවය. එහෙයින් මේ විෂයට අදාළව තර්කානුකූල හා විද්‍යාත්මක කරුණු කිහිපයක් කෙරෙහි අපගේ අවධානය යොමු කරමු.

අනාවැකි කීම ඉහත උපුටා දක්වා ඇති ශබ්දකෝෂ අර්ථ දැක්වීම අනුව එය  විද්‍යාවක් ලෙස හඳුන්වා දී තිබුණද  එය සැබැවින්ම අනුමානය පදනම් කර ගත් කලාවකි. එහි මුල්ම කොන්දේසිය වන්නේ අනාවැකි ප්‍රකාශ කිරීමේදී හැකි තරම් සාමාන්‍යය ව්‍යවහාරයන් භාවිත කිරීමයි. එමෙන්ම නිශ්චිත ස්ථාන දින වකවානු පුද්ගලයින්

හා අවසන් ඵලය ආදිය සඳහන් නොකිරීමයි. ඒ සඳහා පහත උදාහරණ දෙස අපගේ අවධානය යොමු කරමු.

1. මේ සතියේ ඔබට සුබ අසුබ මිශ්‍ර ඵල ගෙන දෙයි.
2. තම කාර්යයන් ඉටු කර ගැනීම සඳහා දැඩි වෙහෙසක් දැරීමට සිදු වේ.

3. ගමට මෙන්ම සිතට ද අවිවේකී සතියකි.

4. කෙටි ගමන් බිමන් වැඩි සතියකි.

5. ව්‍යාපාර කටයුතු හා ශාස්ත්‍රීය කටයුතු වල යෙදී සිටින අයට නව ආකාරයකින් හා නව ප්‍රබෝධයකින් යුතුව සිය ‍ර්‍රියාව කර ගෙන යෑමට ඉඩකඩ උදා වේ.

6. පවුලේ නෑ හිතමිතුරන් අතර හොඳ හිත තහවුරු වේ.

7. දෛනික කටයුතු අපහසුවකින් තොරව කර ගෙන යෑමට ඉඩකඩ ඇති කෙරේ.

8. යහපත් ශරීර සෞඛ්‍යයක් පවත්වා ගෙන යෑමට හැකි වේ.

මෙවැනි කාරණා එකක් කිහිපයක් හෝ සියල්ලම වුව යම් පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩායමකට හෝ අදාළව සත්‍යය වීමට හැකි බව ප්‍රකාශ කිරීමට විශේෂ ශාස්ත්‍රීය දැනුමක් හෝ විධි ක්‍රමයක් අවශ්‍ය නොවන බව සුපරීක්ෂාකාරීව සිතන අයෙකුට තේරුම් ගත හැකි වනු ඇත.

යම් විශේෂ කරුණක් පිළිබඳව අනාවැකි ප්‍රකාශ කිරීමේදී මුළු දිවයිනටම පොදු වන අයුරින් එය කරන බව අපි දැක ඇත්තෙමු. තවද එවැනි දෑ

ඒකාන්ත වශයෙන්ම සිදු වන බව නොකියා අවිනිශ්චිත අනුමානයන් භාවිත කරමින් පවසන බවද දක්නට ලැබේ. උදාහරණයක් ලෙස 2006 / 06 / 05 දින 'සම්පත' ජ්‍යොතිෂ්‍ය පුවත්පතේ මුල් පිටුවේ පළ වූ පහතින් උපුටා දක්වා ඇති අනාවැකි විමසා බලමු.

1. ඉදිරි දින කිහිපය තුළ ලංකාවේ සමහර ප්‍රදේශ වලට හිම වැසි ලැබීමට පුළුවන.

2. ආහාර විෂ වීමක් පිළිබඳ පුවත් රට පුරා පැතිර යෑමට පුළුවන. එහි ප්‍රතිඵලයක්

වශයෙන් බොහෝ දෙනෙකුට රෝහල් ගත වීමට සිදු විය හැක.

වියළි කාලගුණ තත්ත්වයන් යටතේ නුවරඑළිය හා කඳුකර ප්‍රදේශයන් හි හිම හෝ අයිස් පතනය වීම සිදු වේ. එමෙන්ම ආහාර හෝ ප්‍රමිතියෙන් තොරව මත්පැන් (කසිප්පු වැනි) විෂ වීම් නිසා රෝහල් ගත වීම පිළිබඳ පුවත් ද එතරම් දුලබ නොවේ. එහෙයින් මෙවන් අනාවැකි සැබෑ වීමේ අවස්ථා ද (සම්භාවිතාව) ඉහළ අගයක් ගනී.

එමෙන්ම එම පිටුවේම පළ වූ මෙම සඳහන ද විමසිල්ලෙන් කියවන්න. “කර්මාන්ත ශාලා වලට බලවත් අපල කාලයක් උදා වේ. කිසිවකු බලාපොරොත්තු නොවූ මොහොතක විශාල කර්මාන්ත ශාලාවක ගින්නක් හට ගැනීමට පුළුවන. ත්‍රස්තවාදී ක්‍රියා නව මුහුණුවරකින් කලඑළි බැසීමට පුළුවන”.

“බලාපොරොත්තු නොවූ මොහොතක” ගිනි ගැනීම් ඇති වී නැත්තේ කවදාද? පැරණි ව්‍යාපාරික ස්ථාන ගිනිකෙළි කම්හල් ආදිය ගිනි ගැනීම්

එතරම් දුලබ නොවන බව ද ඒ පිළිබඳව විමසිල්ලෙන් පරීක්ෂා කරන අයෙකුට වටහා ගත හැකි වනු ඇත. අනෙක් කාරණය ත්‍රස්තවාදී ක්‍රියා එකම මුහුණුවරකින් සිදු වී නොමැති බව සැමට පහසුවෙන් වටහා ගත හැකි කාරණයකි. පූර්ව නිගමනයන් හා පසුගාමී පක්ෂපාතිත්වයන්ගෙන් තොරව විවෘත මනසකින් බලන අයෙකුට ජ්‍යෝතිෂයේ පදනම මිත්‍යාව බව වටහා ගැනීමට ඉහතින් දැක් වූ සරල කරුණු ටික වුවද ප්‍රමාණවත්ය.

# ජ්‍යෝතිෂය ඉගෙන නොගෙන අනාවැකි පැවසීමේ කලාව

1. යම් කාරණයක් ඒකාන්ත වශයෙන්ම සිදු වන බව තනි අනාවැකියක් මගින් ප්‍රකාශ කිරීමෙන් වළකින්න. අනාවැකි ගණනාවක් පවසන්න. එවිට එයින් එකක් හෝ කිහිපයක් හෝ සිදු වීමට ඇති සම්භාවිතාව වැඩිය. අනාවැකි වැඩි වන ප්‍රමාණයට සාර්ථකත්වය ඉහළය. මක්නිසාද යත් මේ අනාවැකි වල අලුත් ආශ්චර්යයන් ප්‍රකාශ නොවන නිසාත් එවා සාමාන්‍ය ජීවිතයේ දී අපි සැවොම ඉදහිට

අන් විදින සිදු වීම් නිසාන්ය. යම් අනාවැකියක් ඉෂ්ට වූ විට ඒ පිළිබඳව උදම් ඇනීම සම්ප්‍රදායකි. මෙකී අනාවැකිකරුවන්ගේ 'වාසනාවට' අසාර්ථක වූ අනාවැකි පිළිබඳව කිසිවෙකු ප්‍රශ්න කිරීම බොහෝ විට සිදු නොවන්නකි.

2. ජනතාව බියගන්වන කුතුහලය දනවන අනාවැකි ක්ෂණික ජනප්‍රියත්වයක් ලැබෙනු ඇත. එම බිය හා අවිනිශ්චිතභාවය හේතු කොට ගෙන රක්ෂණ සමාගම් වලට හා ජ්‍යෝතිෂය පුවත්පත් වලට

වැඩි ඉල්ලුමක් ඇති වී ලාභයක් උපයා ගත හැක. උදාහරණ වශයෙන් වැසි සමය ආසන්නයේ දී අනාවැකි පළ කිරීම පහසුම හා ඵලදායිතම අනාවැකි බවට නිසැකවම පත් වනු ඇත. ඉදිරියේදී මහා ගංවතුරක් විශාල නාය යාමක් වැනි අනාවැකි ඉතා සුලබය. සුළු වර්ෂාවකින් වුව ද කොළඹ හා තදාසන්න නාගරික මහා මාර්ග වතුරින් යට වන නිසා එවැනි අනාවැකි අත්දුටුයි ප්‍රත්‍යක්ෂයි. පසුගිය කාලගුණ දත්ත හා කාලගුණ දෙපාර්තමේන්තුවේ ඉදිරි

අනාවැකි ද මෙහි දී බොහෝ උපකාරී වනු ඇත. අවාසනාවට ශ්‍රී ලංකාව හා බොහෝ ආසියාතික රටවලට ඉතා විශාල ව්‍යසනයක් ගෙන දුන් සුනාමිය පිළිබඳව කිසිදු ජ්‍යෝතිෂඥයෙකුට අනාවැකි කීමට නොහැකි වීම ඔවුන්ගේ වංචා සහගත පිළිවෙත හෙළිදරවු කරන්නක් නොවේද?

3. නිර්මාණාත්මක ජ්‍යෝතිෂ අනාවැකි සඳහා ‘සුබසෙත’ පුවත්පතේ 2006 / 06 / 02 දින කලාපයේ ප්‍රධාන ශීර්ෂ පාඨය මෙසේ කියවා රස විඳින්න.

"ජූනි 18 වැනිදා කුජ ශනි ග්‍රහ යුද්ධයෙන් කුජ ජය ගනී. ගුරු නවයේ මර්මස්ථාන වීමෙන් රටේ ප්‍රගතියට නව වැඩපිළිවෙලක් - අධ්‍යයන අංශ රෝහල් බැංකු වෙළඳ කාර්මික අංශවල දියුණුවක් නව මුහුණුවරකින් රටේ පාලනයේ සුවිශේෂ වෙනස්කම් ඉදිරි ගමන නව මාවතකට කාලගුණ වෙනස්වීම් තුළින් සුළි සුළං ගංවතුර තර්ජන මුහුදු යාත්‍රාවලට හානි...."

මෙහි සඳහන් දියුණු නව මුහුණුවරකින් සුවිශේෂී නව

මාවත් ආදී විශේෂණ මැනීමට අර්ථ දැක්වීම් නොමැත. ඉහතින් ගෙන හැර දැක්වුයේ සාමාන්‍ය බුද්ධිය මෙහෙයවා සිතන අයෙකුට වුවද ජ්‍යොතිෂයේ සැඟවුණු මිත්‍යාව ඉතාම පහසුවෙන් අවබෝධ කර ගත හැකි තොරතුරුය.

ජ්‍යොතිෂය හා නවීන විද්‍යාව

ජ්‍යොතිෂය අනාවැකි පැවසීමේ පදනම වශයෙන් භාවිත කරන්නේ ආකාශස්ථ වස්තුන්ගේ චලිතයන් හා ඒවායේ සාපේක්ෂ පිහිටීමය. ආකාශස්ථ වස්තුන්ගෙන්

ජ්‍යෝතිෂය භාවිත කරනුයේ සෞරග්‍රහ මණ්ඩලයට සහ හිරු රාශි චක්‍රයට අයත් තාරකා රාශි 12 ක් පමණි. දැනට ඇති දත්තයන් අනුව වසර තුන් දහසකට පමණ පෙර ආරම්භ වූ ජ්‍යෝතිෂය වර්තමානයේද පවතින්නේ ආරම්භක යුගයේ පැවති තත්ත්වයේමය. මෙයින් පැහැදිලි වන්නේ ජ්‍යෝතිෂය වූ කලී කිසිදා ඉදිරියට නොයන කිසිදා දියුණු නොවන ශාස්ත්‍රයක් බවය. එහි අක්‍රියාකාරීත්වය පෙන්නුම් කරන ප්‍රථම සාක්ෂිය මෙයයි.

දෙවන කරුණ වනුයේ හිරු රාශි චක්‍රය පිළිබඳ සත්‍යය තත්ත්වයයි. මේෂ වෘෂභ මිථුන කටක මේ ආදි වශයෙන් තාරකා රාශි 12 ක් තම පදනම වශයෙන් ගෙන ජ්‍යෝතිෂය විසින් සමස්තය කිරා මැන බලයි. ජ්‍යෝතිෂඥයින් සිතා ගෙන සිටින්නේ රාශි ගැසුණු තාරකා මණ්ඩල අහසේ ඈත යන්න හා පොළොව වටා අංශක 360 ක අහස් පරාසයක යථෝක්ත තාරකා රාශි 12 පිහිටා ඇත යන්නය. මෙමගින් අදහස් වනුයේ අනෙකක් නොව මින් වර්ෂ තුන් දහසකට පමණ

පෙර සිට නිව්ටන්ගේ කාල සීමාවන් දක්වා වස්තූන්ගේ චලනයන් පිළිබඳ සත්‍යය හඳුනා ගැනීමට තිබූ නොහැකියාව සහ චලිතය පිළිබඳව තිබූ අල්ප දැනුමේ දෝංකාරයයි. එහෙත් නවීන තාරකා විද්‍යානුකූලව බලන විට රාශි ගැසුණු තාරකා පොකුරු හෝ හිරු රාශි චක්‍රය යනුවෙන් හෝ දෙයක් සැබැවින්ම නොමැත. තරු රාශි වශයෙන් හෝ හිරු රාශි චක්‍රය වශයෙන් හෝ පෙනෙන්නා වූ සංසිද්ධිය හුදු දෘශ්‍ය සංසිද්ධියක් පමණි. උදාහරණයක් වශයෙන් හිරු

රාශි චක්‍රයට සම්බන්ධ වන රාශි දෙකක් ගෙන විමසා බලමු. ජෙමිනි හෙවත් මිථුන රාශියේ ප්‍රධාන තාරකා සහ ඒවායේ සිට පොළොවට ඇති දුර ප්‍රමාණයන් පහත දක්වා ඇති අයුරුය.

බීටා පොලොක්ස් ආලෝක වර්ෂ 35

ඇල්ෆා කැස්ටර් ආලෝක වර්ෂ 45

ගැමා ඕල්හීනා ආලෝක වර්ෂ 105

මියු ටිජැට් ආලෝක වර්ෂ 160

එප්සෙලෝන් මෙබ්සුටා ආලෝක වර්ෂ 1080

(A light year is 5,865,696,000,000 miles (9,460,800,000,000 kilometers). That's a long way!)

ලිඹ් හෙවන් සිංහ රාශියෙ හි ඇති ප්‍රධාන තාරකා සහ ඒවායේ සිට පොළොවට ඇති දුර ප්‍රමාණයන් මෙසේය.

ඇල්ෆා රෙග්යුලස් ආලෝක වර්ෂ 84

ගැමා අල්ජීබා ආලෝක වර්ෂ 190

බීටා ඩිනිබෝලා ආලෝක වර්ෂ 43

ඩෙල්ටා ෂොෂ්මා ආලෝක වර්ෂ 82

එප්සෙලෝන් අසාඩ් ඔස්ට්‍රේලිස් ආලෝක වර්ෂ 340

මේ අනුව ජ්‍යෝතිෂඥයන් විසින් සිතා ගෙන සිටින පරිදි තාරකා රාශියක් වශයෙන් පෙනී යන දර්ශනය සැබැවින්ම එසේ පවතින්නක් නොවන බැව් ඉහත දුර ප්‍රමාණයන් අනුව සසඳා බැලීමේදී ඉතා හොඳින් පැහැදිලි වේ. මෙය පැහැදිලි ව අවබෝධ කර ගත හැකි

උදාහරණයක් විමසා බලමු. විදුලි පහන් කණු සිටුවා ආලෝකමත් වූ මහා මාර්ගයක රාත්‍රී කාලයේදී ඔබ මෝටර් රථයකින් ගමන් කර බලන්න. මාර්ගයේ ඈත ඉදිරියෙන් ලොකු වංගුවක් තිබෙන ස්ථානයක් සැලකිල්ලට ගන්න. මාර්ගයේ ඈත සිටින ඔබට පෙනෙනුයේ එළි පොකුරකි. එහෙත් ඔබ වංගුවට අවතීර්ණ වූ විට එළි පොකුර විසිර ගොස් සාමාන්‍යයෙන් සමාන දුරකින් සිටුවා ඇති ලයිට් කණු ඔබට පෙනී යනවා ඇත. එබැවින් දුරක දී ඔබ දුටු එළි පොකුර

සත්‍යයක් මෙන් දැසට පෙනී යන අසත්‍යයකි. තරු රාශි වශයෙන් පෙනෙනුයේ ද එවැනි සත්‍යයක් මෙන් දර්ශනය වන අසත්‍යයන්ය. එහෙත් ජ්‍යෝතිෂය ස්වකීය භාවිතයේ දී මෙම අසත්‍යය සත්‍යයක් වශයෙන් දකී. එය ජ්‍යෝතිෂයේ අවිද්‍යාත්මකත්වය පෙන්නුම් කරන දෙවන සාධකයයි.

හුදු දෘශ්‍ය සංසිද්ධියක් වන හිරු රාශි චක්‍රයට සාපේක්ෂව ගනිමින් ජ්‍යෝතිෂඥයින් විසින් අහස අංශක 360 ක කෝණික පරාසයක් වශයෙන් සලකමින් ද රාශි දෙකක් අතර

අවකාශ පරාසය අංශක 30 කට බෙදා වෙන් කර ද ඇත. ජ්‍යෝතිෂඥන්ට නවීන තාරකා විද්‍යාව පිළිබඳ අල්ප දැනුමක්වත් නොමැත යන්න මෙම සාවද්‍යය ගණනය කිරීම් මගින් ඉතා පැහැදිලිව ඔප්පු වන කරුනකි. ජ්‍යෝතිෂඥයින් සිතා ගෙන සිටින්නේ සූර්යයා සහ පෘථිවිය වටා අංශක 360 ක් වූ වෘත්තාකාර පරාසයක මෙම තරු රාශි 12 පිහිටා ඇති සෙයකි. මේ අනුව ඔවුන් සිතා සිටිනුයේ පෘථිවිය සූර්යයා වටා ගමන් කරන බවකි. එහෙත් සත්‍යය වනුයේ පොළොව

ස්වකීය චලිතයේදී අහසේ එක් වරක් පසු කළ ලක්ෂයකට නැවත කිසිදා නොඑන බවය. යමෙක් සූර්ය කේන්ද්‍රික රාමුවකට සාපේක්ෂව එය තුළ සිර වී ආකාශස්ථ වස්තූන් පරීක්ෂා කිරීමේ දී දකිනුයේ ජ්‍යොතිෂඥයින් විසින් දකින දෙයමය. නිව්ටන් ට පවා ඉන් ඔබ්බට දැකීමට නොහැකි විය. හේතුව සූර්ය ග්‍රහ මණ්ඩලය සිදු කරන චලිතය ගැන දැනුමක් නිව්ටන් ට නොතිබූ නිසාය. පෘථිවිය සූර්යයා වටා සිදු කරන වෘත්තාකාර හෝ ඉලිප්සාකාර චලිතයක් සහ පෘථිවිය වටා

වෘත්තාකාර අහස් පරාසයක පිහිටි හිරු රාශි චක්‍රයන් සත්‍යයක් සේ ජෝත්‍යිෂඥයින් ට පෙනී යනුයේ පෘථිවිය ඇතුළත් සූර්ය ග්‍රහ මණ්ඩලය සිදු කරන චලිතය සහ ඉන් එහාට සිදු කරන චලිතයන් ගැන ඔවුන් සැබැවින්ම නොදන්නා නිසාය. මෙය ජෝත්‍යිෂයේ අවිද්‍යාත්මකත්වය පෙන්නුම් කරන තෙවන සාක්ෂියයි.

දැන් අප දරු උපතක් පොළොවේ සිදු වන විට එම වේලාවට උදා වී තිබෙන තරු රාශිය පාදක කර ගෙන කේන්ද්‍රයක් හෙවත් හඳහනක්

ජ්‍යෝතිෂඥයා විසින් සාදන අන්දම විමසා බලමු. යම් දිනක යම් වේලාවක දරුවෙකු උපදින විට ඒ වෙලාවේ දී උදා වී තිබුණේ මිථුන රාශිය යැයි සිතන්න. මිථුන රාශිය උදා වී ඇති බැව් යන්න ඇස් දෙකට පෙනී යන දෙයකි. එහෙත් සත්‍යය එයද? මිථුන රාශියට අයත් ප්‍රධාන තාරකා පහක් ඇති බැව් ඉහතින් පෙන්වා දෙන ලදී. ඒවාට ඇති දුර ප්‍රමාණය ද ඉහතින් දක්වා ඇත. එහෙත් මිථුන රාශිය උදා වී ඇති බැව් දැසට පෙනී ගියත් එතැන මිථුන රාශිය  නොමැත. සත්‍යය නම්

මිථුන රාශියේ එක් තාරකාවක් එතැන තිබී ඇත්තේ දරු උපතට ආලෝක වර්ෂ 35 කට පෙරය. අනෙක් තාරකා ආලෝක වර්ෂ 45, 105, 160, 1080 යනාදී වශයෙන් වූ අතීතයේ දී එතැන තිබී ඇති තාරකාය. තාරකා යනු ඉතා වේගයෙන් චලිත වන වස්තූන් බැවින් උක්ත තාරකා එකක් වත් දරුවා උපදින වේලාවේ එතැන ඇත්තේ නැත. තාරකාවකට පොළොවේ සිට ඇති දුර ප්‍රමාණයේ ආලෝක වර්ෂ ගණන අනුව ඒවායින් නිකුත් වූ ආලෝකය පොළොව කරා පැමිණීමට කාලය ගත වේ.

එබැවින් කේන්ද්‍රයක් නැතිනම් හඳහනක් වශයෙන් ගණන් සාදා ජ්‍යෝතිෂඥයින් විසින් සත්‍යයක් නොව මනස්ගාතයකි. මෙය ජ්‍යෝතිෂයේ අවිද්‍යාත්මකත්වය පෙන්නුම් කරන සිව්වැනි සාක්ෂියයි.

මනුෂ්‍ය චින්තනයේ ස්වභාවය වනුයේ එකක් පසුපස තවෙකක් වශයෙන් සිදුවීම් සිදු වන විට දෙවන සිදු වීමට පාදක වුයේ පළමු වන සිදුවීමය යන්න විශ්වාස කිරීමය. මෙය ඇතැම් විට නිවැරදි විය හැකිය. ඇතැම් විට වැරදි විය හැකිය. මෙනයින්

ජ්‍යෝතිෂයේ ප්‍රධාන මූලධර්මය ගැන කීමට ඇති වැදගත් ප්‍රකාශය වනුයේ එමගින් කරන අනාවැකි ලෝකය තුළ එසේම සිදු වන බවට කිසිම පිළිගත් සහතිකයක් නොමැති බවය. මෙය තහවුරු කරන ඓතිහාසික උදාහරණ කිහිපයක් දිය හැකිය. වර්ෂ 1186 දී එවකට දැන ගෙන තිබූ සියලුම ග්‍රහලෝක තුලා රාශිය කෙලින් ස්ථානගත විය. ජ්‍යෝතිෂ ශාස්ත්‍රානුකූලව තුලා යනු වාතයට අධිපතියා වන බැවින් ජ්‍යෝතිෂඥයින් ප්‍රකාශ කර තිබූ පරිදි අති විශාල සුළි

කුණාටුවක් හමා ලෝක විනාශය සිදු වන බවය.

ජර්මනියේ ජනයා කුණාටුවෙන් බේරීම පිණිස අගල් කපා ඒවාට බැස රැකවරණය සලසා ගන්නට කටයුතු කළහ. බෙසන්තියම් මාලිගය වටා උස් තාප්ප බැඳ එයට ආවරණයක් ඇති කරන ලදී. මැත පෙරදිග වැසියෝ ගුහා සහ බිංගෙවල් තුළට වන්හ. එහෙත් සැවොම මවිත කරමින් කිසිවක් සිදු නොවී ග්‍රහයෝ විසිර ගියෝය.

වර්ෂ 1524 දී මෙලෙසම සියලුම ග්‍රහයෝ කුම්භ රාශිය එල්ලේ ස්ථානගත වූහ. කුම්භ රාශිය ජලයට අධිපතියා වශයෙන් ජ්‍යෝතිෂයේ සැලකේ. ජ්‍යෝතිෂඥයින් ප්‍රකාශ කළේ ලොව විනාශ කරන දෙවන මහා ජල ගැල්මක් සිදු වන බවය. එහෙත් සිදු වූ කිසිවක් නොමැත. ඒ එකලය. මෙකල සිදු වූ සිදුවීම් කිහිපයක් ගැන අපගේ විචාරක්ෂිය යොමු කරමු. වර්ෂයක් පාසාම ජ්‍යෝතිෂඥයින් විසින් ඒ ඒ රටවල් සහ පොදුවේ සමස්ත ලෝකය සඳහා පලාපල

විස්තරයක් ප්‍රසිද්ධියට පත් කරති. එහෙත් ඉන්දියාවේ සිදු වූ රජීව් ගාන්ධි ඝාතනය එහි සිදු වූ භූමි කම්පා ඉරානයේ සිදු වූ මහා භූමි කම්පාව සුනාමි ව්‍යසනය ඇමෙරිකාවේ ලෝක වෙළඳ  මධ්‍යස්ථානය විනාශ කිරීම ආදී ලෝකයේ ප්‍රධාන සිදුවීම් ගැන ලෝකයේ කිසිදු ජ්‍යෝතිෂඥයෙක් ඒවා සිදු වීමට පෙරාතුව දැන ගෙන සිටියේ නැත. මෙය ජ්‍යෝතිෂයේ අවිද්‍යාත්මකත්වය ඔප්පු  කරන පස් වන සාක්ෂියයි.

ජ්‍යෝතිෂයේ අවිද්‍යාත්මකත්වය පිළිබඳව ඉහතින් ඉදිරිපත්

කරන ලද කරුණු මගින් සෘජුව ඔප්පු වන්නේ ජ්‍යෝතිෂය යන්න මිත්‍යාවක් යන්නය. එහෙයින් එමගින් ජනයාට වන හෝ කළ හැකි කිසිදු සේවයක් නොමැත. කනගාටුදායක කරුණ වන්නේ මෙරට උගත් මෙන්ම සාමාන්‍ය ජනයාද ජ්‍යෝතිෂය පසුපස දුවන දිවිල්ලය. 2014 මාර්තු මාසයේ සිදු වූ මැලේසියානු ගුවන් යානය අතුරුදහන් වීම පිළිබඳව කිසිදු ජ්‍යෝතිෂඥ යෙකුට එය සිදු වීමට පෙර අනාවැකියක් පැවසීමට හෝ ඉන් පසු මෙම අතුරුදහන් වූ ගුවන් යානය සොයා ගැනීමට

කිසිදු හෝඩුවාවක් ලබා දීමට හැකියාවක් ලැබී නොමැත. මෙම සියලු කරුණු පදනම් කර ගෙන ජ්‍යෝතිෂය යනු සහතික වශයෙන්ම මිනිසා මුළා කරන මිත්‍යාවක් ලෙස සලකා ප්‍රතික්ෂේප කළ යුතු ව ඇත.

(ඉහතින් දක්වා ඇති බොහෝ කරුණු උපුටා ගනු ලැබුවේ 2007 මැයි ‘විමර්ශන’ සඟරාවෙනි)

ජ්‍යෝතිෂය හා ඉස්ලාමය

ඉස්ලාමය සහමුලින්ම ජ්‍යෝතිෂය ප්‍රතික්ෂේප කරයි. අනුමානය මත පදනම් වූ මිත්‍යා ප්‍රබන්ධයක් ලෙස ඔප්පු වී ඇති

ජ්‍යෝතිෂය පමණක් නොව එහි සියලු අංග ද ඉස්ලාමය දැඩි ලෙස ප්‍රතික්ෂේප කරයි. ජ්‍යෝතිෂවේදියෙකු වෙත ගොස් ඔහුගේ අනාවැකි වලට සවන් දීම එම මිත්‍යා ශාස්ත්‍රය හැදෑරීම වැනි ජ්‍යෝතිෂයට අදාළ සියලු කරුණු ඉස්ලාමය තහනම් කොට ඇත. මේ පිළිබඳව මුහම්මද් ධර්ම දූතයාණන් (එතුමා කෙරෙහි විශ්වයේ අධිපති සත්‍යය වූ එකම දෙවිඳුන්ගේ ආශීර්වාදය හා සාමය අත්වේවා) විසින් පවසා ඇති කරුණු කෙරෙහි අපගේ අවධානය යොමු කරමු.

“අනාවැකි කියන්නෙකු (දෛවඥයෙකු) හමු වී යමක් විමසන්නේ ද ඔහුගේ සලාතය (දෛනික පස් වේල නැමදුම) දින 40 කට ප්‍රතික්ෂේප වනු ඇත.” (මුස්ලිම් 5440)

“යමෙකු අනාවැකි කියන්නෙකු (දෛවඥයෙකු) හමු වී ඔහු පවසන දෑ විශ්වාස කළේ නම් මුහම්මද් හට පහළ කළ දෑ (ඉස්ලාමය - අල් කුර්ආනය) ප්‍රතික්ෂේප කළ අයෙකු බවට ඔහු පත්වන්නේය.” (අබූ දාවූද් 3895)

ජ්‍යෝතිෂඥයින් අනාවැකි කියන්නන් දෛවඥයින් පේන කියන්නන් වැනි අයගේ මිත්‍යා වෘත්තිය ඉස්ලාමය කෙතරම් දැඩි අයුරින් ප්‍රතික්ෂේප කරන්නේ ද යන්න මුහම්මද් ධර්ම දූතයාණන් (එතුමා කෙරෙහි විශ්වයේ අධිපති සත්‍යය වූ එකම දෙවිඳුන්ගේ ආශීර්වාදය හා සාමය අත්වේවා) විසින් පවසා ඇති ඉහත ප්‍රකාශනයන්ගෙන් ඉතා හොඳින් පැහැදිලි වෙයි. මිනිසා අසත්‍ය හා වංචාකාරී රැවටිලි වලින් මුදවා ගැනීම ඉස්ලාමයේ එක් ප්‍රධාන අංගයකි. මෙම

වංචාකාරී වෘත්තීය පිළිබඳව අල් කුර්ආනය ඉදිරිපත් කරන කරුණු කෙරෙහි ද අවධානය යොමු කරමු.

අදෘශ්‍යමාන අතීන්ද්‍රිය හා ඇතැම් අවස්ථාවන් හි  පාරභෞතික කරුණු පිළිබඳව අනාවැකි පළ කිරීම ජ්‍යෝතිෂයේ ප්‍රධානතම කාර්යයයි. මේ පිළිබඳව අල් කුර්ආනයේ වදනක් කෙරෙහි අවධානය යොමු කරමු.

“ගුප්ත දෑ හි යතුරු ඔහු (අල්ලාහ්) සතුය. ඔහු හැර අන්

කිසිවෙකු ඒවා නොදනියි.” (අල් කුර්ආන් 6:59)

ඉතා සංක්ෂිප්තව ඉහතින් ඉස්ලාමීය මූලාශ්‍රයන්ගෙන් උපුටා දක්වන ලද කරුණු අනුව ජ්‍යෝතිෂය සහමුලින්ම තහනම් වන අතර මිනිසාව මෙවන් මිත්‍යාවන්ගෙන් ආරක්ෂා කර ගැනීම ඉස්ලාමීය ඉගැන්වීම් හි එක් වැදගත් අංගයකි. එහෙයින් අනුමානය හා මිත්‍යාව පදනම් කර ගත් ජ්‍යෝතිෂය හා එයට ඇලුණු අනෙකුත් සියලු ඉගැන්වීම් වලින් වැළකී සත්‍යය

අවබෝධ කර ගෙන ජීවත් වන්නට අධිෂ්ඨාන කර ගනිමු.

## ඉස්ලාම් පිළිබඳ ප්‍රශ්න සහ පැහැදිලි කිරීම් – 3.

ප්‍රශ්නය

විශේෂයෙන් අප රටේ පුවත්පත් මගින් පෙර භවය හෙවත් පෙර උත්පත්ති පිළිබඳ විස්තර පවසන වාර්තා නිතර අසන්නට ලැබේ. අප දන්නා තරමින් ඉස්ලාමීය ඉගැන්වීම් තුළ පෙර උත්පත්ති හෝ භවයේ සැරිසැරීමක් පිළිබඳ විශ්වාසයක් නොමැත. මෙතරම් පැහැදිලි සාක්ෂි තිබියදී මෙම

## සංකල්පය ප්‍රතික්ෂේප කරන්නේ කෙලෙසද? කරුණාකර පැහැදිලි කරන්න.

පැහැදිලි කිරීම

මෙය ඉතාමත්ම වැදගත් මෙන්ම සැමගේ අවධානයට යොමු විය යුතු ප්‍රශ්නයක් ලෙස අපි සලකන්නෙමු. යුදෙව්, කිතුනු හා ඉස්ලාමීය ඉගැන්වීම් අනුව මිනිසාගේ මිහිතලය මත වූ ජීවිතයේ නිවැරදි විශ්වාසය පදනම් කර ගනිමින් ඔහු කරන්නා වූ යහ, අයහකම් අනුව මරණින් මතු ජීවිතයේ දී විපාක විඳින්නට සිදු වන බව

ඉගැන්වේ. මෙම ඉගැන්වීම් පිළිබඳව ද ඉහත සඳහන් දහම් තුන අතරේ එක්තරා ප්‍රමාණයක වෙනස්කම් දක්නට ඇත. නමුත් පෙර භවයක් හෝ තම කර්ම විපාකය අනුව සසරේ සැරිසැරීමක් පිළිබඳ මතය මෙම දහම් තුනම ප්‍රතික්ෂේප කරයි. මෙම මාතෘකාව පිළිබඳව සාකච්ඡා කිරීමේදී අන් දහම් හි ඇති මෙම සංකල්පයේ නිරවද්‍යතාව විමසුමට ලක් කිරීමට සිදු වන හෙයින් මෙම ලිපිය අන් දහම් අස්ථිරතාවට හෝ අපහාසයට ලක් කිරීමට දරන උත්සහයක්

ලෙස කරුණාකර නොසලකන්න. අන් දහම් පිළිබඳව අපහාසාත්මක ලෙස හෝ ඉස්ලාමය පමණක් පිළිගන්නා ලෙස බලපෑම් කිරීම හෝ අල් කුර්ආනයේ ඉගැන්වීම් අනුව සම්පූර්ණයෙන්ම තහනම් කාර්යයන්ය.

"(විශ්වාසවන්තයිනි), අල්ලාහ් හැර කුමන දැයක් ඔවුන් අයැදින්නේද එයට නුඹලා අපහාස නොකරවූ." (6:108)

"දහම සම්බන්ධව බල කිරීමක් නොමැත. අයහමඟින් යහමඟ

පැහැදිලිව ඇත." (අල්-කුර්ආන් 2: 256)

"සත්‍යය නුඹගේ පරමාධිපතිගෙන් යැයි (නබිවරය නුඹ) පවසවු. එහෙයින් කැමති අයෙකු විශ්වාස කරත්වා! කැමැති අයෙකු ප්‍රතික්ෂේප කරත්වා!" (අල්-කුර්ආන් 18:29)

අප මෙම මාතෘකාවට අවතීර්ණය වන්නට අපේක්ෂා කරන්නේ ඉහත අල් කුර්ආන් ඉගැන්වීම් දැඩි ලෙස පිළිපදිමිනි. නමුත් ඇතැම් තොරතුරු උපුටා දැක්වීමේ දී තම සාම්ප්‍රදායික

ආගමික මතවාදයන් හා ගැටීමක් සිදු වන්නේ නම් අප කෙරෙහි උදහස් නොවන ලෙසද කාරුණිකව ඉල්ලා සිටින්නට කැමැත්තෙමු.

මෙම උත්පත්ති පිළිබඳව පවසන දහම් හි ඇති සංකල්පයන් පිළිබඳව විමසුමක යෙදෙන්නට අප අපේක්ෂා නොකරන අතර අපගේ කරුණු පැහැදිලි කිරීම හැකි පමණින් ඉහත ප්‍රශ්නයට අදාළ වන පරිදි ඉදිරිපත් කරන්නට අදහස් කරන්නෙමු.

ඉහතින් නගා ඇති ප්‍රශ්නය අනුව පෙර උත්පත්ති සංකල්පය සත්‍යයක් නම් යුදෙව්, කිතුනු හා ඉස්ලාම් වැනි දහම් පත් වන්නේ ඉතාම බලවත් අසීරුතාවකටය. එහි ප්‍රතිලෝමය වශයෙන් පෙර උත්පත්ති සංකල්පය බිඳ වැටේ නම් එම සංකල්පය පිළිගත් දහම් හි ප්‍රධාන අත්තිවාරම ම ඉරිතැළී යන්නට මෙම සාධකය හේතු විය හැකි බව අප සැමට තර්කයෙන් තොරව පිළිගන්නට සිදු වනු ඇත. එහෙයින් ඉතාමත්ම ප්‍රවේශමෙන් මෙම

පැහැදිලි කිරීම කරන්නට අදහස් කරන්නෙමු.

ඉස්ලාමීය, කිතුනු හා යුදෙව් දහම් මගින් මූලික වශයෙන් ඉදිරිපත් කොට ඇත්තේ මිනිසාට යහ හා අයහ ක්‍රියා කිරීමට ඇති එකම අවස්ථාව මිහිතලය මත ඇති මිනිස් ජීවිතය පමණක් බවයි. මරණින් මතු ජීවිතයක් ඇති බව මෙම දහම් උගන්වන අතර එය මිහිතලය මත මිනිසාගේ නිවැරදි විශ්වාසය හා ක්‍රියාවන් පිළිබඳ විශ්වයේ අධිපති දෙවිඳුන් අභියස පවත්වනු ලබන විනිශ්චයකින් පසු

## ස්වර්ගය හෝ අපාය තීන්දු කරනු ලබන්නක් බව පැහැදිලි කොට ඇත.

“සෑම ආත්මයක්ම මරණය අත්විඳින්නේය. (මළවුන් කෙරෙන්) නැගිටුවනු ලබන දින නුඹලාගේ (මිහිතලය මත ජීවිතයේ) ප්‍රතිඵල නුඹලාට පූර්ණව දෙනු ලබන්නේමය. කවරෙකු නිරයෙන් ඈත් කරවනු ලැබ ස්වර්ගයට ඇතුළු කරවනු ලබන්නේ ද සැබැවින්ම ඔහු ජය ලැබුවේය. තවද ලෞකික ජීවිතය මායාකාරී විඳීමක් හැර වෙනෙකක් නොවේ.” (අල් කුර්ආනය 3:185).

මෙම සංකල්ප පාරභෞතික අතීන්ද්‍රිය කරුණු හෙයින් මෙම මත පිළිබඳව නිගමනයකට එළඹිය හැක්කේ මිනිසාට පමණක් උරුම වූ විචාර බුද්ධිය උපයෝගී කර ගැනීමෙන් පමණක් බව පිළිගන්නට අපහසුතාවක් කිසිවෙකුට ඇතැයි අපි නොසිතන්නෙමු. පෙර උත්පත්තියක් පිළිබඳව කරුණු පැවසූ සිද්ධියක් පිළිබඳව කරන ලද පර්යේෂණයක ප්‍රතිඵල පහතින් උපුටා දක්වා ඇත්තෙමු. එච්. එස්. ඩී. සේනාරත්න  මහතා විසින් සකස් කරන ලද මෙම ලිපිය

උපුටා ගත්තේ ‘හේතුවාදී සංදේශය’ නමැති ග්‍රන්ථයෙනි (සරසවි ප්‍රකාශකයෝ).

තලවාකැලේ තිලකරත්න ඥානතිලකා නමින් නැවත ඉපදුණේද?

(එච්. එස්. ඩි. සේනාරත්න)

පුනරුත්පත්තිය පැහැදිලිව ඔප්පු වන සාධකයක් තමන් පරීක්ෂා කර බැලූ බවත් ඒ පිළිබඳ සියලු කරුණු තක්සේරු කර බලා තලවාකැලේ වියුරින් තිලකරත්න නමැති ළමයා ඥානතිලකා නමින් කොත්මලේ නැවත ඉපදී ඇති බව තීරණය

කර ඇති බවත් ‘ලංකාවේ ප්‍රථම ශාස්ත්‍රීය පුනරුත්පත්ති පර්යේෂකයෝ’ කියා සිටිති. පර්යේෂක කණ්ඩායමේ නායකයා හැටියට එහි වාර්තාව ‘නැවත උපන් දැරිය’ නමින් සිංහලෙන් ලියූ ආචාර්ය එච්. එස්. එස්. නිශ්ශංක මහතා හැකි නම් එම පර්යේෂණය ශාස්ත්‍රීය නොවේ යැයි ඔප්පු කරන ලෙස අභියෝග කර ඇත. මම එම අභියෝගය පිළිගනිමි.

තිලකරත්න ඊළඟ ආත්මයේදී ගැහැනු ළමයෙකු වුයේ කෙසේද යන්න විග්‍රහ කිරීමේදී තිලකරත්න ඒ ජීවිතයේදීම

ගැහැනු බවට පත්වන ලකුණු තිබුණු බව මේ පර්යේෂකයෝ කියා සිටිති.

{මහාචාර්ය රේරුකානේ චන්දවිමල මහනාහිමි ගේ "අභිධර්මයේ මූලික කරුණු" නම් ග්‍රන්ථයේ 135 වැනි පිටුවෙන් පහත සඳහන් කොටස උපුටා දක්වන්නට කැමැත්තෙමු. මිහිතලය මත තම ජීවිතයේ දී ලිංග පරිවර්තනයක් පිළිබඳ කරුණු මෙහි විග්‍රහ කොට ඇත. මෙම කරුණු කෙරෙහි ඔබගේ විචාරාත්මක අවධානය යොමු කරවන්නට කැමැත්තෙමු.

“සමහර විට ලිංග පරිවර්තනයෙන් ස්ත්‍රීහු පිරිමි බවට ද, පුරුෂයෝ ගැහැණු බවට ද පැමිණෙති.

“තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො ඉත්ථිලිංගං පාතුභූතං හොති

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනියා පුරිසලිංගං පාතුභූතං හොති” යි විනයෙහි ද ඒ බව දක්වා තිබේ. ලිංග පරිවර්තනය වන්නේ ද කර්මයෙනි, බලවත් අකුශලයෙන් පුරුෂ ලිංගය අතුරුදහන් වී ස්ත්‍රී ලිංගය

පහලවේ. ලිංග පරිවර්තනය පිළිබඳව කියයුතු කර්ම තත්ත්වය ගැඹුරු කරුණෙකි. එය අභිධර්මය නොදන්නවුන් වරදවා ගන්නා තැනකි. මනුෂ්‍යාත්මභාවය කුශලයකින්ම ලැබෙන්නකි. මිනිස් සිරුරෙහි කුශලකර්මජ රූප මිස අකුශල කර්මජ රූප නැත. මිනිස් පුරුෂයා විසින් ලිංග විපර්යාසයට හේතු වන බලවත් අකුශලයක් කළ කල්හි ඔහු ගේ ජනක කර්මය (උත්පත්තියට හේතුවූ කර්මය) එයින් දුබල වේ. එය ඉන් පසු පුරුෂ භාව රූපයන් ඉපදවීමට

නොසමත් වෙයි. කර්මයේ පීඩනයෙන් දුබල ජනක කර්මය ඉන් පසු ඒ සන්තානයෙහි ස්ත්‍රී භාව රූප උපදවයි. කලින් පැවැත්තාවූ පුරුෂ භාව රූප ඒවායේ ආයුෂය ගෙවීමෙන් නිරුද්ධ වෙයි. ඉන් පසු පුරුෂයා ස්ත්‍රියක් වෙයි. පසුව ඔහුගේ සන්තානයෙහි ස්ත්‍රී භාව රූප ඇති කළා වූ ද කලින් පුරුෂ භාව රූප ඇති කළා වූ ද කර්මය එකක් මය. එය ඔහුගේ උත්පත්තියට හේතුවූ කුශල කර්මය ම ය. මේ විපර්යාසයට දුරින් හේතු වන අකුශල කර්මය දැක්වීම පිණිස එය ප්‍රධාන කතා

කිරීමේදී බලවත් අකුශලයෙන් පුරුෂ ලිංගය අතුරුදහන්වී ස්ත්‍රී ලිංගය පහළ වෙතැයි කියනු ලැබේ.” (135 වැනි පිටුව)}

තිලකරත්න ගැහැනු ළමයින් ඇසුරු කිරීමට කැමති විය. ඔහු දිය සායම් වලින් නියපොතු පාට කළේය. මෙය සම්පූර්ණයෙන්ම අශාස්ත්‍රීය නිගමනයක් නොවේද? ලිංග විපර්යාසය, හැසිරීම සම්බන්ධ කාරණයක් නොව ශරීරයේ හෝර්මෝන සම්බන්ධ කාරණයකි. යම් කෙනෙක් ලිංග විපර්යාසයකට භාජනය වෙමින් සිටිනවාද යන්න තීරණය කළ හැක්කේ

පුළුල් වෛද්‍ය පරීක්ෂණයකින් පමණකි. අවුරුදු 14 පිරිමි ළමයෙකු ගැහැනු ළමුන් ආශ්‍රයට ප්‍රිය කිරීම ලිංග විපර්යාසයක් වන බවට සාධකයක්ද?

වයස දොළහ සහ දාහතර අතර ගැහැනු ළමයින් පිරිමි ළමයින්ට වඩා වේගයෙන් වැඩෙන බවද තිලකරත්න ගේ ශරීරය ගැහැනු ළමයෙකු ගේ ශරීරය වැඩෙන වේගයෙන් වැඩී ඇති බවද මේ පර්යේෂකයෝ තවදුරටත් තර්ක කරති. එකක් වෙහෙසුනොත් ඕනෑම කෙනෙකුට තිලකරත්නට වඩා වේගයෙන් වැඩෙන ඒ වයස්

සීමාවේම ළමයි ඕනෑ තරම් සොයා ගත හැකිය. එවැනි හැම පිරිමි ළමයෙකුම ගැහැනු ළමයින් හැටියට පුනරුත්පත්තිය ලබනැයි මෙම පර්යේෂකයන් සිතනවාද? මේ ළමයා ලිංග විපර්යාසයකට පත් වෙමින් සිටි බව යම් හෙයකින් වෛද්‍ය පරීක්ෂණයකින් හෙළි වුණත් ශ්‍රානතිලකා ලෙස නැවත ඉපදීමේ ක්‍රියාවලිය ඇරඹුණේ තිලකරත්නගේ මරණයටත් කලින් බව එයින් අදහස් වෙනවාද? කොතරම් මෝඩ තර්කයක්ද?

පර්යේෂකයින් පවසන අයුරින් හය හැවිරිදි ඥානතිලකාට ඇගේ කලින් ජීවිතය ගැන මතක තිබේ. එසේ නම් මව කවුද යන්න ගැන ඇයට පැටලීමක් සිදු නොවේද? තලවාකැලේත් කොත්මලේත් අම්මලා දෙන්නෙකු වී යැයි ඇයට සිතුණාද? ඥානතිලකාගේ පෙර ජීවිතය ගැන තොරතුරු සත්‍ය දැයි බැලීමට තමාම ඇගෙන් ප්‍රශ්න කළ බව මහාචාර්ය කේ. එන්. ජයතිලක මහතා දක්වයි.

මහාචාර්යවරයා : බබා මුහුද දැකලා තියෙනවාද?

ඥානතිලකා : ඔව්

මහාචාර්යවරයා : මුහුද රතු පාටයි නේද?

ඥානතිලකා : නෑ නෑ මුහුද නිල් පාටයි, කොළ පාටයි

මහාචාර්යවරයා : මුහුද අයිනේ ගස් තියෙනවාද?

ඥානතිලකා : ඔව්

මහාචාර්යවරයා : මුහුද අයිනේ තේ ගස් රබර් ගස් හොඳට වැවිල තියෙනවා නේද?

ඥානතිලකා : නෑ නෑ මුහුද අයිනේ පොල් ගස් තියෙන්නේ

මහාචාර්යවරයා : මුහුද අයිනේ වෙන මොනවාද තියෙන්නේ?

ඥානතිලකා : සුදු වැලි

උගත් මහාචාර්යවරයාගේ තර්කය නම් ඥානතිලකා මේ ජීවිතයේදී මුහුද දැක නැති නිසා මේ පිළිතුරු වලින් පෙර ජීවිතයක ඇගේ මතකය හෙළි වන බවයි. ප්‍රශ්න කළ අවස්ථාවේ දී ඥානතිලකාගේ වයස අවුරුදු හතකට ආසන්නය. අවුරුදු හතක ළමයෙකු මුහුද ගැන මේ තොරතුරු දැන සිටීම පසුගිය ජීවිතය මතක තිබීමක්ද?

ශාස්ත්‍රීය පර්යේෂණ හැටියට අපට ඉදිරිපත් කර ඇත්තේ මේ විධියේ පර්යේෂණ හා විග්‍රහයන්ය.

තිලකරත්නගේ මරණයත් ඥානතිලකා මවු කුස පිළිසිඳ ගැනීමත් අතර මාස පහක පමණ පරතරය ගැන වජිරාරාම වාසී පියදස්සි හිමියන්ගේ මේ මතය දාර්ශනික අදහසක් සේ ඉදිරිපත් කර තිබේ.

“පරතරය පස් මසකුත් පස් දිනකට නොවැඩි නිසා තිලකරත්න මිය ගොස් මිනිස් උපතක් ලබා ඉන් මිදී නැවත

ඥානතිලකා හැටියට උපන්නා යැයි සිතා ගත නොහැකිය. මිනිස් උපතක් සඳහා මවු කුස තුළ එයට වඩා කල් ගත කළ යුතු හෙයිනි." (167 වැනි පිටුව)

එහෙමම කියන්න බැහැ. තිලකරත්න මේ පස් මස ගැහැනියක කුස තුළ ගත කරද්දී ගබ්සා වීමක් වුණා විය හැකියි!

උන්වහන්සේ තවදුරටත් මෙසේ කියති:

"සත්ත්වයා උත්පත්තිය ගන්නේ මිනිස් යෝනියේ පමණක් නොවන හෙයින් තිලකරත්නට

ඒ කාල සීමාව තුළ මිනිස් නොවන අන් සත්ව යෝනියක ඉපිද ඉන් මිදී ඥානතිලකා හැටියට ඉපදීමට කිසිදු බාධාවක් නැත."

එසේ විය යුතුම නැත. තිලකරත්න භූතයෙකු හැටියට මේ පස් මාසය ගත කළා විය හැකියි! නැත්නම් මදුරුවෙකු, අමීබාවෙකු, බක්ටීරියාවෙකු ආදී වශයෙන් සත්ව යෝනි කීපයක ජීවත් වුණා විය හැකියි! ඒ අතරමැදි කාලය ගැන ඥානතිලකාගෙන් ප්‍රශ්න කරන්නට මේ ශාස්ත්‍රීය පර්යේෂකයන්ට සිතුණේද?

නැත. ඔවුන්ට වුවමනා වුයේ තම බොළඳ මතය තහවුරු කර ගැනීම සඳහා ප්‍රශ්නත් පිළිතුරුත් සීමා කර ගැනීමටය.

1960 නොවැම්බර් 19 ව දා පර්යේෂකයෝ ඥානතිලකා සමග තලවාකැලේ ගියහ (42 වන පිටුව). ඇයට දුම්රිය පොළ, තැපැල් කන්තෝරුව, පන්සල, තිලරත්නගේ ගෙය ආදිය පෙන්වීය. ඊට පෙර ද ඇය තම සොහොයුරා සමග තලවාකැලේ ගියාය (5 වන පිටුව). කලින් ජීවිතය ගැන ඇගේ මතක පිරික්සීමට නොවැම්බර් 27 වන දා

පර්යේෂකයෝ ඇගෙන් ප්‍රශ්න කළහ. මේ පර්යේෂකයන් සම්පූර්ණයෙන් සෑහීමට පත් වන සේ ඈ 19 වන දා දුටු දේවල් 27 වන දා නිවැරදිව විස්තර කළාය.

කොයිතරම් පහසුවෙන් රැවටෙන පර්යේෂකයින් ද? 22 වැනි හා 42 වන පිටු වල පසුව සිදු වූ දේ කලිනුත්, කලින් සිදු වූ දේ පසුවත් සඳහන් කර තිබේ. මෙවැනි පර්යේෂණ වලින් කියවන්නා නොමග නොයැවේ ද? ඥානතිලකාගේ පෙර ජීවිතය ගැන කරුණු සෙවීමට ගිය

“නිෂ්ඵල ගමන් දෙකක්”

වෙනුවෙන් සම්පූර්ණ පරිච්ඡේදයක්ම වෙන් කර තිබේ. පර්යේෂකයින් "බබා ඉස්සර නංගියෙක් ද? මල්ලියෙක් ද?" යන ප්‍රශ්නය නගන්නේ ඥානතිලකාගේ කලින් ජීවිතය හැටියට දැක්විය හැකි තිලකරත්න නමැති මැරුණු ළමයෙකු සොයා ගැනීමෙන් පසුවය.

1960 නොවැම්බර් 1 වන දා ඥානතිලකාගෙන් සවිස්තරව ප්‍රශ්න කර ඇත. ඇසූ ප්‍රශ්න හා ඊට ලැබුණු පිළිතුරු සමහරක් මෙසේය.

ප්‍ර: කොහෙද හිටියේ?

උ: තලවාකැලේ

මෙම ප්‍රශ්නයට දිය හැකි උත්තර රාශියක් ඇත. ගෙදර හිටියා ඉස්කෝලේ හිටියා අම්මා ළඟ හිටියා ආදී වශයෙනි. ඒත් එවැනි උත්තර රැසක් අතරින් ඥානතිලකා දුන්නේ තම කාරණය ඔප්පු කර ගැනීමට පර්යේෂකයන්ට ඉතාම අවශ්‍ය වූ උත්තරයයි!

ප්‍ර: එහෙ ඉන්නකොට කොහෙද ගියේ?

උ: සිරිපාදේ

මෙතැනදීත් මේ ළමයා නියමම උත්තරය තෝරා ගෙන ඇත. කඩේට, මාර්කට් එකට, ළිඳට හෝ ඉස්කෝලෙට ගියා යැයි නොකීවේ ඇයි?

ප්‍ර: බබාගේ තලවාකැලේ ගෙදර තියෙන්නේ මොකක් ළඟ ද?

උ: ඉස්ටෝරුව ගාව... තේ අඹරන ඉස්ටෝරුව ගාව... එහෙ ඉස්ටෝරු ගොඩාක් තියෙනවා. ගෙදෙට්ට යන්න පඩි පෙළක් තියෙනවා.

ඒත් තලවාකැලේට කැඳවා ගිය පසු මේ එකක්වත් හඳුනා

ගන්නට ඇයට නොහැකි විය! පුදුම මතකයක් නේද?

ප්‍ර: බබාට ඒ ගෙදර හොයා ගන්න පුළුවන්ද?

උ: ගෙදර දැන් තියෙනවද දන්නේ නැහැ.

ප්‍ර: ඇයි එහෙම කියන්නේ?

උ: ඇයි එහෙ ගෙවල් ගොඩක් කඩල හදනවනෙ.

මෙය පුදුම උත්තරයකි. එවැනි උත්තරයක් දෙන්න පුළුවන් වන්නේ ඇයට කලින් උගන්වා ඇත්නම් පමණකි. 143 වැනි පිටුවේ සඳහන් වන අන්දමට

තිලකරත්නගේ දෙමව්පියන් කියන්නේ අවුරුදු 2 ½ කට කලින් බවයි. එනම් තිලකරත්නගේ මරණින් පසුය. ඔවුන් එම අලුත් ගෙයි පදිංචියට ආවේ 1959 මැයි මාසයේ දීය.

දැරියගේ වත්මන් ජීවිතයේදී එනම් කොත්මලේ සිටියදී තලවාකැලේ ගෙවල් කඩා දැමූ බව ඇය දැන ගත්තේ කෙසේදැයි සෙවීමට තරම් කල්පනාවක් මෙම ශාස්ත්‍රීය පර්යේෂකයන්ට නොතිබීම කනගාටුවකි.

ප්‍ර: බබාට එහෙ වෙන මොනවාද තිබුණේ?

උ: සල්ලි කැටයක් තිබුණා. මම ඒකට සල්ලි දැම්මා. ඒ සල්ලි වලින් මම නිල්පාට සාරියක් ගත්තා. ඒක ගෙදර අල්මාරියේ තිබුණා.

ප්‍රශ්න කරන අවස්ථාවේදීත් එම සාරිය අල්මාරියේ තිබෙන බව මේ ළමයා දන්නේ කෙසේද? ඇත්ත වශයෙන්ම තිලකරත්න ගත්තේ නිල් සාරියක් නොව කලිසමකි.

ප්‍ර: බබාට එහෙ වෙන මොනවාද තිබුණේ?

උ: සායම් පෙට්ටි දෙකක් තිබුණා.

ප්‍ර: ඔබ ඒවායින් මොකද කළේ?

උ: අක්කයි මායි නියපොතු වල රතු පාට ගෑවා.

(තිලකරත්න ලිංග විපර්යාසයකට පත්වෙමින් සිටි බවට මේ ප්‍රකාශය වැදගත් සාධකයකි)

ප්‍ර: වෙන මොනවද කළේ?

උ: පින්තූර ඇන්දා. පින්තූර පොත් අල්මාරියේ උඩ ඇති. දැන් ඒවා පරණ වෙලත් ඇති.

තිලකරත්නගේ දෙමාපියන් එම ගෙය කඩා දමා අලුත් ගෙයක පදිංචියටආ නමුත් “පරණ” චිත්‍ර පොත් හරියටම තිලකරත්න එවා තැබූ තැනම (අල්මාරිය උඩ) තිබී හමුවිය!

ප්‍ර: බබා වෙන මොනවද කළේ?

උ: කඩදාසි වලින් මල් හැදුවා.

ප්‍ර: තලවාකැලේ දී බබා කවුරුවත් බලන්න හෙම ගියාද?

උ: ඔව්.

ප්‍ර: කවුද?

උ: රැජිනි

තිලකරත්න රැජිනි හැරුණු විට තව බොහෝ දෙනෙකු බලන්නට ගිය බවට සැක නැත. පර්යේෂණ කණ්ඩායමේ සිටි එක් විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකු ගෙන් මේ පර්යේෂණය ගැන මම විමසුවෙමි. ඔහුගේ ලිඛිත පිළිතුරේ අඩංගු පහතින් උපුටා දක්වා ඇති කොටසින් බොහෝ දේ හෙළි වෙයි.

"පුනරුත්පත්තියක් ඇතැයි හෝ නැතැයි හෝ කීමට මට නුපුළුවන. මා ඒ පිළිබඳව ප්‍රත්‍යක්ෂ වශයෙන් කිසිවක් ම නොදන්නා හෙයිනි. කොත්මලේ

ඥානතිලකා බැලීමට මා ද ගිය බව සැබෑය. එහි සිදු වූ සිද්ධීන් මම දිටිමි. එය පුනරුත්පත්තියක් යැයි ප්‍රත්‍යක්ෂ වශයෙන් කීමට මට නුපුළුවන. මා එවකට 'සිළුමිණ' පත්‍රයට දුන් ප්‍රකාශයක ඒ බව විස්තර කර ඇත. එයින් කුඩා ඡේදයක් පොත අග බහා ඇත. එම ඡේදය සුපරීක්ෂාකාරීව කියවුවහොත් මා මෙය පුනරුත්පත්තියට ප්‍රත්‍යක්ෂ සාක්ෂියක් වශයෙන් නොපිළිගන්නා බව පෙනී යනවා ඇත. 'සිළුමිණ'ට දුන් ලිපියෙන් පොතට ගෙන

ඇත්තේ ද පරීක්ෂණයට ඉතාම වාසි වන ඡේදය පමණි. මුළු ලිපියම කියවුවහොත් මා පුනරුත්පත්තියක් ඇතැයි කීමට කොත්මලේ කතාව ප්‍රමාණවත් සාක්ෂියක් ලෙස නොපිළිගන්නා බව පෙනී යනවා ඇත. මා මෙය සනාථ කිරීමට හෝ මේ පිළිබඳව ප්‍රචාරයක් කිරීමට හෝ අද වන තුරු ඉදිරිපත් වී නැත. එම නිසා මා මේ පර්යේෂණයට සහභාගී වුවද ඒ ගැන කරන නිගමනයට මා සම්පූර්ණයෙන් එකඟ නොවන බව කරුණාවෙන් සලකන්න.”

තිලකරත්නගේ මරණ සහතිකය යැයි කියමින් පොතේ කර්තෘ විසින් එක්තරා මරණ සහතිකයක් ඉදිරිපත් කර තිබේ. එය මරණ සහතිකයක පිටපතක් බව ඇත්ත වුවත් මෙහි සාකච්ඡාවට බඳුන් වූ තිලකරත්නගේ මරණ සහතිකය නොවන බව නම් ඉතාම පැහැදිලිය. ඉදිරිපත් කර ඇති මරණ සහතිකයේ දැක්වෙන තොරතුරු මෙසේය.

1. සම්පූර්ණ නම: නොදනී - ජී තිලකරත්න, අරණායක

2. මියගිය ස්ථානය: දිස්ත්‍රික් රෝහල - අරණායක

3. දෙමව්පියන්ගේ නම්: නොදනී

4. වයස: අවුරුදු 16 යි.

5. භූමදානය කළ ස්ථානය: අරණායක දිස්ත්‍රික් රෝහලේ සුසාන භූමිය

මෙය මිනිය භාර ගැනීමට කෙනෙකු නොපැමිණි නිසා රෝහලේ සුසාන භූමියේ අසරණ ලෙස වළලා දමන ලද දෙමව්පියන් ගැන විස්තර නොදන්නා ජී. තිලකරත්න

නමැත්තෙකුගේ මරණ සහතිකයක් බව තේරුම් ගැනීමට කෙනෙකු "ශාස්ත්‍රීය පර්යේෂකයෙකු" විය යුතු නැත. ටියුරින් තිලකරත්නගේ (මෙම සාකච්ඡාවට අදාළ තිලකරත්න) දෙමාපියන් විසින් ඔහු ඇතුළු කරන ලද්දේ දිස්ත්‍රික් රෝහලට නොව ග්‍රාමීය රෝහලටයි (175 වැනි පිටුව). එහි දැක්වෙන පරිදි ඔහුගේ පදිංචිය අරණායක නොව තලවාකැලේ ය. ජී. තිලකරත්නගේ වයස අවුරුදු 16 වුවත් ටියුරින් තිලකරත්නගේ වයස අවුරුදු 12 මාස 4 ක් බව පොතේ දැක්වේ. (ටියුරින්

තිලකරත්නගේ අම්මා කියන පරිදි ඔහුගේ වයස අවුරුදු 12 මාස 4 වුණත් පොතේ කර්තෘ කියන පරිදි අවුරුදු 13 මාස 9 කි). වියුරින් තිලකරත්න මිය යන විට ඔහුගේ දෙමාපියන් ඒ ඇඳ අසළ සිටි අතර ඔහුගේ මිනිය තලවාකැලේට ගෙන ගොස් එහි භූමදානය කරන ලදී (21, 175 සහ 57 වැනි .

ඥානතිලකා තම පෙර ජීවිතය ගැන කීවේ යැයි කියන දේ කර්තෘ විසින් වෙන වෙනම තක්සේරු කර ඇත. ප්‍රකාශ 61 න් 46 ක් සත්‍යයයි ඔහු කියයි. 4 ක් අඩක් සත්‍යය. 2 ක් වැරදිය. 4

ක් සත්‍ය විය හැකිය. 2 ක් අසත්‍ය විය හැකියි. 2 ක් නිගමනය කළ නොහැකි විය. ඔහුගේ සත්‍යසත්‍ය විනිශ්චය හා අර්ථ විග්‍රහයන් ද ඔහුගේ අන් විග්‍රහයන් ට දෙවැනි නැත.

“මගේ අම්මා සුදුයි”

විග්‍රහය: අම්මා සුදු නැති නමුත් ඇතැම් ළමයින් තම ආදරය දැක්වීමට එසේ කියන නිසා මෙය සත්‍ය විය හැකිය!

“මගේ අයියා කෙනෙකුට තලවාකැලේ කඩයක් තිබුණා”

විග්‍රහය: එහෙම කඩයක් තිබුණේ නෑ. ඒත් තිලකරත්නගේ ඥාතියෙකුට අරණායක කඩයක් තිබුණා.

"ඩොරා/ලෝරා කියා අක්කා කෙනෙක් මට හිටියා"

විග්‍රහය: තිලකරත්නට එවැනි සොහොයුරියක් සිටියේ නැත. එහෙත් අසල ගෙයක ලෝරා නමින් ගැහැනු ළමයෙක් සිටියාය.

(එහෙත් ඥානතිලකාට නම් මේ නම් දෙකින් ම ඥාති සොයුරියන් ඇත.)

සත්‍ය හැටියට හඳුන්වා ඇති පිළිතුරු මෙවැනි ඒවායි.

අම්මා ඉන්නවා

තාත්තා ඉන්නවා

අක්කා කෙනෙක් හිටියා

පොඩි කාලේ අක්කා ගැහුවා

ඉස්කෝලේ ගියා

තැපැල් කන්තෝරුවට ගියා.

පර්යේෂකයින්ට එවැනි “සත්‍ය” ප්‍රකාශ 46 ක් පමණක් ලැබීම ගැන මම මවිත වෙමි!

විනිශ්චය කළ නොහැකි වූ ප්‍රකාශ දෙක ගැන පර්යේෂකයන් කියන්නේ කුමක් ද? එම ප්‍රකාශ ශ්‍රද්ධාතිලකාවත් ඇගේ දෙමව්පියන්වත් කී කරුණු නොවන බවයි. එසේ නම් දෙවියනේ ලෝකෙ රටේ නොයෙක් දෙනාගේ ප්‍රකාශ මේ ග්‍රන්ථයට ඇතුළත් කළේ ඇයි?

ඕනෑම මිත්‍යා විශ්වාසයක් විද්‍යාත්මකයි කීම අද මෝස්තරයක් වී තිබේ. මහාචාර්ය කේ. ඇන්. ජයතිලක මේ පොතට පෙරවදනක් ලියමින් "පුනරුත්පත්තිය වැනි දෙයක් වශීකරණය මගින්

පෙන්නුම් කළ හැකි" බව එෆ්. එල්. මාර්කියුස් කියා ඇතැයි දක්වයි. පෙන්නුම් කළ හැකි සියලුම දේ සත්‍ය නොවේ. මාර්කියුස් ඒ ගැන කියන දේ බලමු.

"මෝහනය මගින් පුනරුත්පත්තිය ඔප්පු කිරීම, මිනිසුන් පහසුවෙන් රැවටෙන අන්දම දක්වන කනගාටුදායක කතන්දරයකි. ඇමෙරිකාවේ බෙහෙවින් විකිණෙන ප්‍රබන්ධ කතා නොවන ගනයට අයත් එක් පොතක් මෝහනය මගින් පුනරුත්පත්තිය ඔප්පු වෙතැයි දක්වන එකකි. මෝහනය

පිළිබඳ මහා කැළඹීමක් ඇති කරවන බවට විස්තර කර ඇති මේ පොත ඇසුරෙන් සිනමා පටයක් ද නිපදවා ඇති අතර එම පොත හිස් වැල්වටාරම් ගොඩක් ලෙස හැඳින් විය යුතුය. ‘වශීකාරක ප්‍රතිගමනය’ ලෙස හැඳින්වෙන ක්‍රියාවලියේදී සාමාන්‍යයෙන් සිදු කරනු ලබන්නේ මෝහනය හෙවත් වශීකරණය යටතේ පුද්ගලයා අවුරුද්දෙන් අවුරුද්ද ශූන්‍යය දක්වා අතීතයට ගෙන ගොස් නැවත එයිනුත් ඈත කලින් ජීවිතයකට ගෙන යාමයි. එවිට ඈත ඈත - පෙර ශත වර්ෂයක

ගත කළ - ජීවිතයක් ගැන කතා කරතියි කියනු ලැබේ. ඔහු නිතරම කතා කරන්නේ ඉතා ඈත අතීතයක් ගැනය. මෑත කාලයක් ගැන කීවොත් එහි පරීක්ෂණ දුර්වලතා අපමණය. මෝහනය කරනු ලැබූ පුද්ගලයෙකුට, ඔහු වෙනත් රටක වෙනත් කාලයක විසූ කිසියම් තැනැත්තෙකු යැයි කීමෙන් ඔහු එය විශ්වාස කරන අතර එම විශ්වාසයෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහුට ඒ නියම චරිතය ආරූඪ කර ගෙන ඒ පිළිබඳ ප්‍රශ්න වලට පිළිතුරු ද දිය හැකි වෙයි. මෝහනය

කරන්නා විසින් දෙන ලද උපදෙස් ද මෝහනය ලබන්නාගේ පසුබිම පිළිබඳ තොරතුරු නොදන්කම ද නිසා ඇතැම් විට පුනරුත්පත්තියක් වැනි දෙයක් පෙන්නුම් කළ හැකිය. තමා අනාගතයේ දී කරන දේවල් ද මෝහනය කරන ලද පුද්ගලයා ලවා විස්තර කොට මෙය අනාගතයට ද පැතිර වීමට සමහරුන් උත්සාහ කර ඇත. අවුරුදු දෙසීයකට පසුව සිදු වන දේවල් ගැන කී විට එය ඇත්ත ද නැත්ත ද යනු සෙවිය නොහැකිය. එහෙත් අවුරුද්දක් ඇතුළත හෝ අද සිට

සතියක් ඇතුළත සිදු වන දේ පැවසීමට තැත් කරන පුද්ගලයා මහත් කරදරයකට පත් වෙයි. එසේ පැවසුවහොත් අනාවකියෙහි සත්‍යසත්‍යතාව දැන ගැනීමට හැකි නිසාය. දැන් අනාගතය කරා ප්‍රගමනය වීමට වඩා අතීතය කරා ප්‍රතිගමනය වීම පිළිබඳ අපගේ විස්තරය දෙසට හැරෙමු. එක් ඉහත ආත්මභාවයක් ගැන කීම තවත් ආත්මභාව කීපයක් ගැන විස්තර නොකියා තහවුරු කළ නොහැක්කකි” (Hypnosis – Fact and Fiction – F. L. Marcuse – Pages 183-184).

## මහාචාර්ය ජයතිලකගේ කීම කෙබන්දක්දැයි මින් හෙළි වෙයි. සුප්‍රකට බුයිඩ් ම’ෆි පුනරුත්පත්ති කතාව ගැන මාකියුස්ට කියන්නට ඇත්තේ කුමක් ද?

“කූට වෛද්‍යවරයන් විසින් මෝහනය තම වාසියට හරවා ගෙන තිබීම අවාසනාවකි. වඩාත් අවාසනාවන්ත කාරණය නම් වෛද්‍ය වරුන්ගේ අවිචාරාත්මක විශ්වාස වලට මෙය සම්බන්ධ ව තිබීමයි. බුයිඩ් ම’ෆි සිද්ධිය මේ තත්ත්වය අන්තයටම ගෙන යාමකි. වෙනත් කෙනෙක්

මෝහනය කළ පසු අවුරුදු සිය ගණනකට ඇත විසූ බ්‍රයිඩ් ම’ෆි නමැත්තියගේ සිහිය මතු වී ආවේ යැයි කියනු ලැබේ. මෙවැනි බ්‍රයිඩ් ම’ෆි ලා විශාල ගණනක් සිටි අතර ඉදිරියටත් හමු වනු ඇත.” (එම - 102 වැනි පිටුව).

වර්ජීනියා ටයිග් මහත්මිය මෝහනය කළ විට ඇය කලින් ජීවිතයක බ්‍රයිඩ් ම’ෆි නමැති අයර්ලන්ත ජාතික කාන්තාවක් බව කීවාය. එකල අයර්ලන්තය ගැන නොයෙකුත් විස්තර ඇය කීවාය. ඇය කුඩා කල මහලු අයර්ලන්ත කාන්තාවක ඇසුරේ

සිටි බව හෙළි වීමෙන් පසු මේ පුනරුත්පත්ති කතාව පිළිබඳ මිනිසුන්ගේ උනන්දුවක් නැති විය. මෝහනය මගින් ඉහත ආත්මයේ තොරතුරු සොයා පුනරුත්පත්තිය ඔප්පු කළ හැකි දක්ෂ මෝහන ශාස්ත්‍රඥයන් ලංකාවේ සිටීම අපේ වාසනාවකි! මෝහනය මගින් පුද්ගලයන් රැසකගේ ඉහත ආත්ම වල තොරතුරු තමා හෙළිදරවු කර ගත් බව අමරසිරි වීරරත්න නම් මහතෙක් ‘සිළුමිණ’ පත්‍රයෙහි පළ කළ ලිපියක් මගින් දක්වයි. ඒ මහතා හෙළිදරවු කළ

තොරතුරු වලින් බිඳක් පහතින් දක්වා ඇත්තෙමු.

1. මාක්ස් ප්‍රනාන්දු නැමැත්තා ක්‍රි. පූ. දෙවැනි සිය වසේ සිට දුටුගැමුණු රජුගේ යුද හමුදාවේ සෙබලෙක්ව සිටියේය! පසු ආත්මයක ඔහු දේවතාවෙකි!

2. හ’බට් නමැති ශිෂ්‍යයා කැනඩාවේ ගුවන් නැවියෙකි.

3. ජේසුදාසන් නමැති දෙමළ කතෝලික ළමයා බදුල්ලේ වෙළෙන්දෙකි.

4. පූජ්‍ය සාරානන්ද හිමි 19 වැනි සිය වස අග භාගය

ආරම්භයේ ප්‍රංශයේ සිටි ඉංග්‍රීසි ජාතිකයෙකි.

5. පූජ්‍ය ධම්මාවාස හිමි ඉහත ආත්මයේ දේවතාවෙකි! ඊට පෙර භාතිය රජුගේ ඇමති වරයෙකුව සිටියේය.

6. මෝහන ශාස්ත්‍රඥයාගේ ලේලියක් පෙර ආත්මයේ රත්නපුර රජයේ රෝහලේ සේවය කළ හෙදියකි.

7. ඔහුගේ තවත් ළඟ ඥාතිවරියක් රත්නපුරයේ කහවත්ත වතුයායේ සේවය කළාය. එකල ඇය පිරිමියෙකු විය. ඔහුගේ නම ගාඩ්වින්

වීරසිංහය. 1848 දී කමලා පෙරේරා නැමැත්තියක සමග විවාහ වූ ඔහුට උපාලි සහ නන්දසිරි නමින් පුතුන් දෙදෙනෙකු වූහ. කහවත්ත වතුයායේ අධිකාරී වූයේ බ්ලේක් නමැති ඉංග්‍රීසි ජාතිකයෙකි. විශ්‍රාම ලැබීමෙන් පසු ගාඩ්වින් කෝට්ටෙගොඩට පැමිණ ‘නිමල්පාය’ නමැති නිවසක විසුවේය. 1917 දී ඔහු මිය ගියේය.

පුදුමයට මෙන් මේ මෝහන ශාස්ත්‍රඥයා මේ පුනරුත්පත්ති කතා එකක්වත් සත්‍යතාව සොයා බැලීමට හා ඔප්පු

කිරීමට උත්සාහ ගෙන නැත! මෝහන ප්‍රතිගමනය මගින් ඉහත ආත්මයේ තොරතුරු හෙළි වෙතැයි කීම ප්‍රලාපයක් පමණක් නොව ප්‍රෝඩාවක් ද වෙතැයි ආචාර්ය ම'කියුස්ගේ කීම කෙතරම් සත්‍යයක් ද? මෝහන ප්‍රතිගමනය මගින් පෙර ආත්මයේ තොරතුරු සෙවීම පිළිබඳව වීරරත්න මහතාගේ කියමන ඥානතිලකා කතාවට තමාද සහභාගී වූ බවට ඔහු කියන කතාව තරමටම මනස්ගාතයකි! "අපි නිශ්ශංක මහතාත් සමග ලංකාවේ ප්‍රථම පුනරුත්පත්ති

පර්යේෂණය පැවැත්වූයෙමු" යැයි වීරරත්න මහතා කියතත් නිශ්ශංක මහතා තමාට සහය වූවන්ගේ නම් ලැයිස්තුවෙ හි වීරරත්න මහතාගේ නම ඇතුළත් කර නැත!

පර්යේෂණය අගය කරමින් මහාචාර්ය ඉයන් ස්ටීවන්සන් මහතා 'අපට' ලිපියක් එවූ බව වීරරත්න මහතා එක් පොතක දක්වයි. ඔහු එම ලිපියෙන් උපුටා ගත් කොටසක් ද පළ කර ඇත. එහෙත් සත්‍යය නම් එම කොටස අඩංගු ලිපිය මහාචාර්ය ස්ටීවන්සන් විසින් පූජ්‍ය පියදස්සි හිමියන්ට

පෞද්ගලිකව එවූ එකක් බවයි! පූජ්‍ය පියදස්සි හිමියන්ට එවූ එම ලිපියේ මහාචාර්ය ස්ටීවන්සන් මෙසේ කියයි. “ඉන්දියාවේ මෙබඳු සිද්ධීන් 15 ක් පමණ මම සොයා බැලුවෙමි. එහෙත් ඥානතිලකා සිද්ධිය ඒ සියල්ල අතර ඉතාම හොඳ සිද්ධි කීපයෙන් එකකි”. මේ විකාර පුනරුත්පත්ති කතාව ඔහු සොයා බැලූ සිද්ධීන් අතර ඉතාම හොඳ සිද්ධි කිහිපයෙන් එකක් නම් මහාචාර්ය ස්ටීවන්සන්ගේ අනෙකුත් පර්යේෂණ ගැන කියනුම කවරේද?

එච්. එස්. ඩී.
සේනාරත්න  මහතා විසින්
සකස් කරන ලද ඉහත ලිපිය
උපුටා ගත්තේ 'හේතුවාදී
සංදේශය' නමැති ග්‍රන්ථයෙනි
(සරසවි ප්‍රකාශකයෝ). අප
සාකච්ඡා කරන මාතෘකාවේ
වැදගත්කම සලකා එහි
සත්‍යසත්‍යතාව පිළිබඳව
ප්‍රමාණවත් සාක්ෂි හා සාධක
ඉදිරිපත් කරන්නට අපි බැඳී
සිටින්නෙමු. මෙම මතයට
අනුකූලව තිලක් සේනාසිංහ
මහතා විසින් 'විමර්ශන'
සඟරාවේ 2007 මැයි කලාපයේ
'ගජබින්න පුනරුත්පත්ති

කතාවකට ඇති පදමට කරුණු පිරුණු ලක්ෂාන්ගේ ඇත්ත කතාව’ යන මාතෘකාව යටතේ පළ කර තිබූ ලිපිය ද ඔබගේ අවධානය පිණිස පහතින් උපුටා දක්වා ඇත්තෙමු.

‘ගජබින්න පුනරුත්පත්ති කතාවකට ඇති පදමට කරුණු පිරුණු ලක්ෂාන්ගේ ඇත්ත කතාව’

(තිලක් සේනාසිංහ)

කටාන විද්‍යාලෝක විද්‍යාලයේ 9 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ලක්ෂාන් අරවින්ද, සිංහල බෞද්ධ පවුලක දරුවෙකි.

එහෙත් පසුගිය දින කිහිපය තුළ ඔහු හිටිහැටියේම තමන් ද්‍රවිඩ ගැහැනු ළමයෙකු බව ප්‍රකාශ කරන්නටත් ද්‍රවිඩ බසින් කතා කරන්නටත් පටන් ගත්තේය. මේ අරුම පුදුම සිද්ධියෙන් තම විදුහලේ ගුරු සිසුන් තුළ හට ගත්තේ මහත් විමතියකි. විදුහල්පති ලක්ෂ්මන් විජේරත්න මහතා තුළ ද ඒ පිළිබඳ එක් සැකයක් හට ගත්තේය. රටේ වත්මන් තත්ත්වය අනුව එල්. ටී. ටී. ඊ. සංවිධානයේ කොටි තරුණියක් සිංහල පිරිමි ළමයෙකුගේ වෙස් ගන්වා එවා ඇතැයි මේ සිද්ධිය

සම්බන්ධව විදුහල්පතිවරයාගේ මූලික අනුමානය විය. ඒ අනුව ඔහු කලාප අධ්‍යක්ෂ කාර්යාලයට ද මෙය දැනුම් දී ඉන් පසු කොච්චිකඩේ පොලිස් ස්ථානයට පැමිණිල්ලක් ද කළේය.

ඒ අනුව කොච්චිකඩේ පොලීසිය මගින් ප්‍රශ්න කිරීම සඳහා පසුගිය 25 දා ලක්ෂාන් පොලිස් භාරයට ගන්නා ලදී. පොලීසියේදී ලක්ෂාන් ගේ හැසිරීම අමුතු විය. ඔහුට එහිදී සිංහල මුළුමනින්ම අමතක විය. ලක්ෂාන් දිගටම ද්‍රවිඩ බස කතා කරන්නට වූ අතර

කොච්චිකඩේ පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක හාරුන් ඩුල් මහතා පවසන අන්දමට ඔහු හසුරුවා ඇත්තේ යාපනේ ද්‍රවිඩ ජාතිකයින් භාවිත කරන ව්‍යවහාරයන් මුසු ද්‍රවිඩ බසකි. මෙහිදී පොලිස් ස්ථානාධිපති වරයා ද ඔහුගෙන් ද්‍රවිඩ බසින් ම ප්‍රශ්න කර ඇත. එහිදී ලක්ෂාන් ද්‍රවිඩ බසින් දුන් පිළිතුරු වල සිංහල අනුවාදය පහතින් දැක්වේ.

“මම ඉගෙන ගත්තේ යාපනයේ හඳුන්කාලි අම්මාගේ කෝවිල අසල තිබෙන තිරුප්පුලි

විදුහලේයි. මට ඉගෙන ගන්න ලැබුණේ තුනේ පන්තියට යනකල් විතරයි. මම ගැහැනු ළමයෙක්. නම ශ්‍රී රාමචන්ද්‍රන් රාජ්. අපේ තාත්තා ශ්‍රී රාමචන්ද්‍රන් රමේෂ් කුමාර්. අම්මා ශ්‍රී රාමචන්ද්‍රන් රාශම්මා. යාපනයේ අපි හිටියේ ලොකු ගේක. අම්මාගේ ලොකු ෆොටෝ එකක් ගෙයි බිත්තියේ එල්ලලා තිබුණා. එතන පිටි පස්සේ බිත්තියේ රහස් සේප්පුවක් තිබුණා. තාත්තා රැට යාළුවොත් එක්ක රත්තරන් බඩුයි සල්ලියි ඒකෙ දානවා. මායි අයියයි තාත්තාට

හොරෙන් ඒවා බලා ගෙන ඉන්නවා. අපේ ගෙදරට නිතරම වෙඩි සද්ද ඇහෙනවා. දවසක් අපේ ගෙදරට බෝම්බයක් වැටුණා. ඒකෙන් තාත්තයි අයියයි දෙන්නම මැරුණා. මාව යාපනයේ සින්දු රාජේශ් කරන් සින්දුජා කියන අංකල්ලා දෙන්නටයි අන්ටිටයි බලා ගන්න දීලා අපේ අම්මා රට ගියා. ඊට පස්සේ මම හැදුණේ ඒ ගොල්ලො ගාව. ඊට පස්සේ මටත් බෝම්බයක් වැදිලා මැරුණා. ඒ මීට අවුරුදු 12 කට කලින්.”

මතුපිටින් බලන ඔනෑම කෙනෙකුට සිතෙන්නේ මෙම දරුවා මේ කියනුයේ සිය පූර්ව ජන්මය පිළිබඳව බවය. ඒ අතර එල්. ටී. ටී. ඊ. සංවිධානයේ බුද්ධි අංශය මගින් ලක්ෂාන් දරුවාට කිසියම් “මානසික විශෝධනයක්” ලබා දී තිබේ ද යන සැකය ද බොහෝ දෙනෙකු තුළ ඇති විය. මේ තත්ත්වය යටතේ ලක්ෂාන්ගේ මව වන හේවා නන්දනී මහත්මියට එදිනම පොලීසියට පැමිණෙන ලෙස දන්වන ලදී.

කොච්චිකඩේ ලොතරැයි පත් අලෙවි හලක සේවය කරන

නන්දනී මහත්මියගේ දරුවන් තිදෙනා අතරින් වැඩිමලා ලක්ශාන් ය. සෙසු දෙදෙනා ද පිරිමි දරුවෝය. ඇගේ කටඋත්තරයෙන් ප්‍රකාශ වූ අන්දමට ලක්ෂාන් ද්‍රවිඩ බසින් කතා කිරීම ඇදහිය නොහැක්කකි. ඔහු කිසිදු ආකාරයකින් ද්‍රවිඩ බස දන්නේ නැත. ඇගේ මේ ප්‍රකාශය අසා සිටින්නවුන් අන්දමන්ද කරවන්නක් වුවාට සැක නැත. ඉන් පසු ලක්ෂාන්ගේ ලිංගභේදය පරීක්ෂා කිරීම සඳහා ඔහු මීගමුව මූලික රෝහලට යවනු ලැබිණි. මෙහිදී

සිදු කරන ලද වෛද්‍ය පරීක්ෂණ මගින් ඔහු සම්පූර්ණ පිරිමි දරුවෙකු බව සනාථ විය.

ඉන් පසු ඔහු නොදන්නා භාෂාවන් කතා කිරීම පිළිබඳ ගැටලුව නිරාකරණය කර ගැනීම සඳහා ලක්ෂාන් රාගම මහ රෝහල වෙත මාරු කර යැවිණි. ඒ පසුගිය 29 වැනි දාය. මේ වන විට ලක්ෂාන් පූර්ව ජන්මයක් පිළිබඳව කතා කරන බවට පුවත්පත් වල විස්තර පළ වන්නට පටන් ගෙන තිබිණි. ඒ අනුව විශාල පිරිසකගේ අවධානය ලක්ෂාන් වෙත යොමු වීම වළක්වා ගත නොහැකි විය.

ඔහු නතර කොට සිටි රාගම මහ රෝහලේ 28 වැනි වාට්ටුවට ලක්ෂාන් ලෙසින් උපත ලත් ද්‍රවිඩ දැරිය බැලීමට මිනිස්සු ගලා එන්නට වුහ.

මේ අතර රාගම රෝහලේ විශේෂඥ  මනෝවෛද්‍ය කේ. ඒ. එල්. ඒ. කුරුප්පු ආරච්චි මහතා දෙමළ 'මළපොතේ' අකුරක් නොදන්නා බව පැවසුණු ළමයෙකු හදිසියේම දෙමළ භාෂාව ව්‍යක්ත ලෙස කතා කරන්නට වීම මත එය සියුම් අන්දමින් විමසා බලන්නට විය. කිසියම් අන්දමකින් එල්. ටී. ටී. ඊ. සංවිධානය විසින්

ලක්ෂාන්ගේ මොළයෙහි ව්‍යුහාත්මක වෙනසක් ඇති කිරීම මගින් ඇති වූ බලපෑමක් නිසා මෙවැනි 'අමුතු භාෂා ඥානයක්' ඔහු තුළ පහළ වී තිබේ ද යන්න නිරීක්ෂණය කිරීම සඳහා වෛද්‍ය කුරුප්පු ආරච්චි මහතා සියුම් උපායක් යෙදීය. ඒ රාගම වෛද්‍ය පීඨයේ ඉගෙනුම ලබන උතුරු ප්‍රදේශයෙන් පැමිණි වෛද්‍ය ශිෂ්‍ය ශිෂ්‍යාවන් කිහිප දෙනෙකුට ලක්ෂාන් සමග කතා කිරීමට ඉඩ සලසා දීමෙනි. ලක්ෂාන් හා කතා බස් කළ මේ වෛද්‍ය සිසුන්ගේ අවසන්

නිගමනය වුයේ ලක්ෂාන් යම් තරමකින් යාපනයේ ව්‍යවහාර වන දෙමළ භාෂාව කතා කරන බවය. එහෙත් එය පොතේ ද්‍රවිඩ භාෂාවකට (සම්භාව්‍ය ද්‍රවිඩ බසට) නැඹුරු බවක් ද ඔවුන්ගේ පොදු මතය විය. ඒ අතරින් අතරට ද්‍රවිඩ නොවන තවත් වචන ද එකතු කරන බව ද ඔවුහු වැඩිදුරටත් අනාවරණය කළහ.

මේ පරීක්ෂණ වලින් පසුව රෝහල් වාට්ටුවට එල්. ටී. ටී. ඊ. ළමයෙකු ඇතුළු කොට සිටින බවට කතා පැතිර යන්නට විය. ඒ අනුව බාහිරින් වැඩි

අවධානයක් ලක්ෂාන්ට යොමු වන්නට වීම නිසා එය ඔහුගේ ආරක්ෂාවට තර්ජනයක් විය හැකි බව රෝහල් බලධාරීන්ගේ මතය විය. ලක්ෂාන් එල්. ටී. ටී. ඊ. ළමා සොල්දාදුවෙකු නම් එය එක් පැත්තකින් ඔහුගේ ජීවිතයට තර්ජනයකි. අනෙක් අතට ලක්ෂාන්ට එල්. ටී. ටී. ඊ. සංවිධානයෙන් මානසික බලපෑමක් වී ඇත්නම් රෝහලේ දී එය අනාවරණය වීම නිසා ඔහුට එල්. ටී. ටී. ඊ. යෙන් ද අනතුරක් විය හැක. මේ තත්ත්වය හේතු කොට ගෙන ලක්ෂාන් ආරක්ෂාකාරී

පසුබිමක් යටතේ වැඩිදුර පරීක්ෂණ සඳහා අංගොඩ මානසික රෝහලට මාරු කර යැවිණි.

මේ වන විටත් ලක්ෂාන් තමා දැරියක බව හා පූර්ව භවයක් පිළිබඳව කියන කතා මුළුමනින්ම නතර කොට ඇත. දැන් ඔහු සාමාන්‍ය ලෙසින් පසුවෙයි. ඔහු කෙරෙන් පළ වන්නේ ද සාමාන්‍ය ළමයෙකුගේ ඇවතුම් පැවතුම් ය. එහෙත් ලක්ෂාන් හිටි අඩියේම මෙවන් මහත් කුතුහලයක් විමතියක් දන්වන අන්දමේ සංසිද්ධියකට මැදි වූයේ කෙසේද? මේ සිද්ධිය

අළලා අපිදු සියුම් පසුබිම් විමර්ශනයක යෙදුනෙමු. ලක්ෂාන් උපත ලබා ඇත්තේ 1992 දෙසැම්බර් මස 08 වැනි දාය. ඔහුගේ ළමා විය ගත වී තිබෙන්නේ වයික්කාලේ තඹරාවිල ප්‍රදේශයේය. නමුත් ලක්ෂාන්ගේ පවුල තුළ සවිමත් බැඳීමක් තිබී නැත. එයට හේතුව ඔහුගේ දෙමාපියන් අතරේ තිබු යම් යම් ගැටුම් ය. ඒ අනුව පසුව සෑහෙන කාලයක් තිස්සේම ලක්ෂාන්ගේ පියා පවුලෙන් වෙන් වී වාසය කොට තිබේ.

ලක්ෂාන්ගේ මව තමන්ගේ මවත් දරු තිදෙනාත් සමග කටාන පදිංචියට පැමිණ ඇත්තේ මීට මද කලකට පෙරදීය. ලක්ෂාන් විද්‍යාලෝක විද්‍යාලයට භාර දී ඇත්තේ මීට මාස දෙකකට පෙරය. ඔවුන්ගේ පියා පවුලෙන් වෙන් ව වාසය කළත් දරුවන් සමග තිබු සබඳතා සහමුලින්ම අතහැර නොතිබූ බවට සාධක තිබේ. විද්‍යාලෝක විද්‍යාලයට ඇතුළත් වූ පසු ලක්ෂාන්ගේ හොඳම මිතුරා බවට පත්ව ඇත්තේ රුක්ෂාන් ය. රුක්ෂාන් සිංහල වුව ද ද්‍රවිඩ බස හොඳින්

හසුරුවන්නට දනියි. විද්‍යාලෝක විද්‍යාලයට යාබද ඉඩමේ පිහිටියේ ශ්‍රී වර්ධනාරාම විහාරයයි. ලක්ෂාන් නව පාසලට ඇතුළු වීමෙන් පසු එම විහාරස්ථානයට නිතර යන්නට පුරුදු විය. තවත් අසල්වැසි දරු කිහිප දෙනෙක් ද සැන්දෑ කාලයට එහි එති.

මේ වස් කාලයයි. එබැවින් සවසට පැමිණ බෝමළුව අතුගා මල් ආසන සෝදා පවිත්‍ර කිරීම වැනි වැඩ කොටසක් මේ දරුවන් වෙතින් ඉටු වෙයි. ශ්‍රී වර්ධනාරාම විහාරාධිපති පදවිය හෙබවූයේ විද්‍යාලෝක

විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති ශාස්ත්‍රපති පූජ්‍ය කරඹෑ සුමන හිමියෝ ය. විහාරස්ථානයේ වැඩ කටයුතු කරන අතරේ කෙළි සෙල්ලමේ ද යෙදෙන මේ දරුවන් අතරින් එක් ළමයෙකු දිනක් සුමන හිමියන්ට ලක්ෂාන් පිළිබඳව මුල් වරට මෙසේ කියා ඇත.

“හාමුදුරුවනේ මෙයා ගැන කියන්න දෙයක් තියෙනවා. අපි පස්සේ කියන්නම්”.

“ගෙදර දොරේ හරි ඉස්කෝලේ හරි ප්‍රශ්නයක් කියනවා නම් දැන් කියන්න. ඇයි ඔක පස්සට

කල් දාන්නේ?” මෙලෙස එහිදී සුමන හිමියන් පවසා ඇත. නමුත් ලක්ෂාන් මෙහිදී නිහඬතාව පළ කළා මිස කිසිවක් කියා නැත. ප්‍රශ්නයක් තියෙනවා නම් විසඳුමකුත් තියෙනවා. “මොකක්ද ප්‍රශ්නේ?” හාමුදුරුවන් යළිත් විමසා ඇත.

“හාමුදුරුවනේ ලක්ෂාන් ගැනු ළමයෙක් ලු” යැයි එවිට අනෙක් ළමයෙකු මුල් වරට පවසා ඇත. මේ අපුරු කතාව අසා හාමුදුරුවන් තුළ සිනා පහළ වුණි.

“තමුසේ කොහොමද ගෑනු ළමයෙක් වෙන්නෙ. තමුසේ ඉලන්දාරියෙක්නෙ. පේන්නැද්ද ඔය දැලි රැවුලත් එන හැටි. අනිත් එක තමුසේ ගෑනු ළමයෙක් නම් ඇයි මේ පිරිමි ළමයි එක්ක සෙල්ලම් කරන්නේ?” යනුවෙන් සුමන හිමියන් පවසා ඇත්තේ ලක්ෂාන් කෙරෙහි උපන් අනුකම්පාවෙනි. නමුත් ඉන් පසු පෞද්ගලිකව සුමන හිමියන් හමු වූ ලක්ෂාන් “හාමුදුරුවනේ මං ගෑනු ළමයෙක් තමයි. මං වැඩිවියට පත් වුණා. අපේ අයියා කියන හින්දයි මං පිරිමි

ළමයෙක් විදියට ඉන්නේ. අයියාට මේක කියන්න එපා. හාමුදුරුවනේ කිව්වොත් මං මරයි” යනුවෙන් හැඬුම්බරව කියා ඇත. එහෙත් මෙය හාමුදුරුවන්ට තේරුම් ගත නොහැකි විය. උන්වහන්සේ දන්නා පරිදි ලක්ෂාන් පවුලේ වැඩිමලාය. “කවුද තමුසෙගෙ අයියා?” හාමුදුරුවන් කාරුණිකව විමසා ඇත්තේ ඒ නිසාය. “අපේ අයියා තමයි රයිගම් එකේ ඩිරෙක්ටර්” යයි ලක්ෂාන් රහසින් පවසා ඇත. මේ කාලයේ මෙවන් කතා පවසන මොහොතේ ලක්ෂාන්

තමා ද්‍රවිඩ බවක් හෝ ද්‍රවිඩ උගුරුවට කතා කර හෝ නැත.

“මට අයියත් එක්ක ටිකක් කතා කරන්න ඕනෑ” යැයි හාමුදුරුවන් පවසා ඇත්තේ මෙම දරුවා පවසන දේ හරිහැටි නොවැටහෙන බැවිනි.

“අයියා රැට ඇවිත් පාන්දරින්ම යනවා හාමුදුරුවනේ. ඒ නිසා එයාව හම්බුවෙන්න බැහැ” යැයි ලක්ෂාන් පවසා ඇත.

තව දින කිහිපයක් යන විට එතෙක් හොඳින් සිංහල කතා කරමින් සිටි ලක්ෂාන් ද්‍රවිඩ උගුරුවට සිංහල උච්චාරණය

කරන්නට පටන් ගෙන තිබේ. මෙය ක්‍රමක්‍රමයෙන් සිදු වුවකි. පන්සලේ වැඩ කටයුතු ගැහැනු ළමයෙකු මෙන් කිසියම් ලාලිත්‍යයකට අනුව කරන බවක් කාටත් පෙනිණ. පාසලේදී ද ඔහු හැසිරී ඇත්තේ ගැහැනු ළමයෙකු ලෙසිනි. මෙම සිදුවීම් වටහා ගත නොහැකි බැවින් සුමන හිමියෝ පාසල් විදුහල්පති හමුවේ මෙය දන්වා සිටියහ. පසුව ලක්ෂාන් පොලීසිය භාරයට ගැනීමෙන් අනතුරුව හාමුදුරුවන් ද ඔහු බලන්නට පොලීසියට වැඩම කොට තිබිණි. එහිදී ලක්ෂාන්

සිටියේ ප්‍රකෘති සිහිය ඉක්මවා ගිය විලාසයකිනි. ඔහු හාමුදුරුවන් පමණක් නොව සිය මැණියන්ව පවා හඳුනා ගැනීම ප්‍රතික්ෂේප කළේය. ඔහු තම මව ගැන කියා ඇත්තේ ඇන්ටි කෙනෙකු යනුවෙනි. ඒ වන විට මේ දරුවා තම පිරිමිකම සේම සිංහලකම පවා ප්‍රතික්ෂේප කොට තිබේ.

දැඩි මානසික අර්බුදයකට ලක් වූ අයෙකුගේ පෞරුෂය බිඳ වැටීම සාමාන්‍ය දෙයකි. එවිට ඔහු හෝ ඇය කෙරෙන් ඇතැම් විට වෙනත් පෞරුෂයක් (ද්විතියික පෞරුෂයක්) ඉස්මතු

වෙයි. යකුන් භූතයන් ආරුඪ වීම, මළවුන් ආරුඪ වීම ආදිය මේ ද්විතියික පෞරුෂයෙන් මතු වීම සම්බන්ධ ව උදාහරණයන් ය. නමුත් විස්මයට කරුණක් වන්නේ මේ දරුවා තමන් කිසිසේත් නොදන්නවා යැයි කී ද්‍රවිඩ භාෂාවෙන් කතා කිරීමය. නමුත් අප විසින් කළ කරුණු විමර්ශනයේදී ඊටද පැහැදිලි පසුබිමක් ඇති බව කරුණු අනාවරණය කර ගත හැකි විය.

ලක්ෂාන් සමීපව ඇසුරු කිරීමට තෝරා ගත් රුක්ෂාන් හොඳින් ද්‍රවිඩ බස දනියි. තම හොඳම මිතුරා ලෙස රුක්ෂාන් තෝරා

ගැනීමට ද එය එක් හේතුවක් වන්නට ඇත. එමෙන්ම ලක්ෂාන් ළමා වියේ පටන් දිවි ගෙවූ වයික්කාල තඹරාවිල ප්‍රදේශය අපේ රටේ උළු කර්මාන්තයට ඉතා ප්‍රසිද්ධය. මේවායෙ හි කම්කරු රකියාවල් වල යෙදෙන ද්‍රවිඩ පවුල් රාශියක් වයික්කාල අවට පදිංචි ව සිටිති. නමුත් ඔවුන්ගේ දරුවන්ට ඉගෙන ගන්නට ද්‍රවිඩ පාසල් ප්‍රදේශයේ නැත. එබැවින් ඔවුන් ඉගෙන ගන්නේ ද සිංහල පාසල් වල සිංහල මාධ්‍යයෙනි. ගෙදර දී දෙමළ කතා කරන මේ දරුවෝ පාසලේදී සිංහල කතා කරති.

වයික්කාල තඹරාවිල පාසලේදී මෙබඳු දරුවන් ලක්ෂාන් ඇසුරු කර ඇත. ඒ අනුව ඔහු තුළ පැවති භාෂා ඉගෙන ගැනීමේ හැකියාව ද ද්‍රවිඩ බස කතා කරන්නට ලක්ෂාන්ට හැකි වීම පුදුමයට කාරණයක් නොවේ. එහෙත් ලක්ෂාන් ද්‍රවිඩ නොදන්නා බව ඔහුගේ මව කියන්නට ඇත්තේ ඇය තම පුතුගේ දෙමළ භාෂා ඥානය ගැන නොදැන සිටීම නිසා බව පෙනෙයි.

ලක්ෂාන් මීට ටික කලකට උඩ දී නොකළ හොරකමකට හසු වී එක් ව්‍යාපාරිකයෙකුගේ තදබල

පහරදීමකට ද ලක් වී තිබේ. ඊට අනතුරුව ඔහුගේ සිත නොයෙකුත් සිද්ධි වලින් ව්‍යාකූලත්වයට පත් ව ඇත. ඒ අනුව දිනපතා පන්සල් විත් එය අතුපත ගා පිරිසිදු කළ මේ දරුවා වරක් මේ මුළු පන්සලම එක බෝම්බයකින් විනාශ කරන්නට තමන්ට පුළුවන් යැයි මිතුරන්ට පවසා තිබේ. ඒ තමන්ටත් අර්ථකථනය කර ගත නොහැකිව හිත යට කැකෑරෙන ද්වේෂයක් නිසා බවට සැක නැත. ලක්ෂාන්ගේ මෙම පෞරුෂය බිඳ වැටීමත් සමග මතු වූ ද්විතියික

පෞරුෂයේදී ඔහු තුළ සැඟ ව තිබූ ද්‍රවිඩ බස උච්චාරණය කිරීමේ හැකියාව තීව්‍ර ලෙසින් ඉස්මතු වී පෙනුණි. ඒ ඔහු තුළ පැවති උප විඥානගත අවශ්‍යතාව මුල් කර ගනිමිනි.

නමුදු හෙට අනිද්දා වන විට ඔහු පෙර ආත්මය ලෙස විස්තර කළ පවුල වැනි පවුලක් පිළිබඳ විස්තරයක් ඊට සමාන සිද්ධියකුත් සමග යාපනය ප්‍රදේශයෙන් මතු වන්නට බැරි කමක් නැත. ඊනියා පුනරුත්පත්ති පරීක්ෂකයන්ට එය තලුමරමින් රටට හෙළි කළ හැකි කතාවක් වනු

ඇත.එහෙත් පුවත්පත් වාර්තාවකින් දුටු හෝ අහම්බෙන් ඇසූ සිද්ධියක් ලක්ෂාන්ගේ මනස ගැඹුරේ තැන්පත් වීම හෙවත් අවරෝධනය වීම හේතු කොට ගෙන ද්විතීයික පෞරුෂය ඉස්මතු වන අවස්ථාවේ එය තමන්ගේ පූර්ව ජන්මයේ සිද්ධියක් ලෙසින් ඔහුගේ මනසින් එළිදුටු බව නිසැකය.

ඉහතින් දෙවනුව උපුටා දැක්වූයේ තිලක් සේනාසිංහ මහතා විසින් 'විමර්ශන' සඟරාවේ 2007 මැයි කලාපයේ

‘ගජබින්න පුනරුත්පත්ති කතාවකට ඇති පදමට කරුණු පිරුණු ලක්ෂාන්ගේ ඇත්ත කතාව’ යන මාතෘකාව යටතේ පළ කර තිබූ ලිපියයි. එහි කර ඇති මනෝවිද්‍යාත්මක විග්‍රහය සමග අපගේ බොහෝ පුනරුත්පත්ති කතාවන් හි යථාර්ථය අවබෝධ කර ගැනීමට මග පෙන්වීමක් ලැබෙනු ඇතැයි විශ්වාස කරන්නෙමු. පුනරුත්පත්ති කතා හුදු ප්‍රබන්ධ බව ඔප්පු කරන බොහෝ සාධක විශේෂයෙන්ම ආගමික මූලාශ්‍ර පදනම් කර ගත් බොහෝ

කරුණු අප වෙත ඇති මුත් එවා ඉදිරිපත් කිරීමෙන් වැළකී සිටින්නට තීරණය කළේ අන් අයගේ ආගමික සන්වේදීතාවන් පිළිබඳ සැලකිලිමත් වීමේ අවශ්‍යතාව නිසාමය. තවත් ඉස්ලාමය පිළිබඳ ප්‍රශ්නයක් හා පැහැදිලි කිරීමක් සමග ‘ඉන්ෂා අල්ලාහ්’ නැවත හමුවෙමු.

## ඉස්ලාම් පිළිබඳ ප්‍රශ්න සහ පැහැදිලි කිරීම් – 4.

ප්‍රශ්නය

2032 වන විට මුස්ලිම් ජනගහනය සිංහලුන් පරදවයිද? එසේ කිරීම සඳහා ශ්‍රී

ලාංකේය මුස්ලිම් ප්‍රජාව සැලසුම් සහගත ලෙස කටයුතු කරන බව විවිධ පාර්ශවයන්ගෙන් චෝදනා එල්ල වෙමින් පවතී. මෙය සත්‍යයක් ද? කරුණාකර පහදන්න.

සිංහල ජාතිවාදීන් විසින් සුළු ජාතීන්ට එරෙහිව පතුරුවනු ලබන එක් මතයක් වන්නේ සිංහල ජනගහනය අඩු වෙමින් තිබිය දී මුස්ලිම් ජනගහනය වැඩි වෙමින් තිබෙන බවයි. දෙමළ ජනගහනය සම්බන්ධයෙන් දැන් මෙම තර්කය මතු නොකෙරෙන්නේ සැහෙන දෙමළ තරුණ පිරිසක්

පසුගිය සමයේ ඝාතනයට ලක් කරන ලද බව දන්නා නිසාය. එයට අමතරව දෙමළ අති විශාල පිරිසක් බෙදුම් වාදී යුද සමයේ රට හැර ගොස් තිබිණි.

පසු ගිය දින වල කොළඹ මුස්ලිම් ජනගහනය වැඩි වීම පිළිබඳ පළ වූ පුවත්පත් වාර්තා වලට ප්‍රතිචාරයක් ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබේ. ඒ මෙසේය:

"කොළඹ නගරයේ ජනගහනයෙන් වැඩි දෙනා සිංහලයන් වන නමුත්, කොළඹ

සිංහල ජනගහනය සියයට 24 කට බසී" යනුවෙන් 2012.12.11 වන දින ‘දිවයින’ පත්‍රයේ පළ වූ ප්‍රවෘත්තියේ 2012 පූර්ව සංගණන තොරතුරු අනුව කොළඹ නගරයේ සිංහල ජනගහනය සියයට 24 ක්, දෙමළ ජනගහනය සියය 33 ක් සහ මුස්ලිම් ජනගහනය සියයට 40 ක් ලෙස සඳහන් කර තිබීම සාවද්‍ය බවත් එම වාර්තාවේ 1971 ලෙස සඳහන් කර ඇත්තේ 1981 ජන සංගණන තොරතුරු බවත්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන

දෙපාර්තමේන්තුව නිවේදනයක් නිකුත් කරමින් කියා සිටී.

කොළඹ නගරය කොළඹ සහ තිඹිරිගස්යාය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකින් සමන්විත වන අතර කොළඹ නගරය ලෙස ඉහත වාර්තාවෙන් පෙන්වා දී ඇත්තේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි ජනගහනය වන බව එහි සඳහන් වේ. 2012 ජන සංගණනයට අනුව කොළඹ නගරයෙ හි සිංහල ජනගහනය සියයට 36.8 ක්, දෙමළ ජනගහනය (ශ්‍රී ලංකා දෙමළ හා ඉන්දියානු දෙමළ)

සියයට 31.8 ක්, ශ්‍රී ලංකා යෝනක ජනගහනය සියයට 29.00 ක් සහ වෙනත් ජන වර්ග වලට අයත් ජනගහනය සියයට 2.4 ක් සිටින බවද දෙපාර්තමේන්තුව තව දුරටත් දන්වා සිටියි."

ඉහත ප්‍රශ්නයෙන් මතු කර ඇති චෝදනා සත්‍යය බව ඒත්තු ගැන්වීම පිණිස අනුබල දෙන මාධ්‍ය ක්‍රියාකාරකම් මෙම 'දිවයින' පුවත්පත් වාර්තාවෙන් පැහැදිලි වන බව අමුතුවෙන් කිව යුතු නොවේ.

ලංකාවේ ජනගහනය පිළිබඳ ඇති විධිමත් සංඛ්‍යාලේඛන අනුව වාර්ගිකත්වය පදනම් කර ගෙන  ජනගහනය පිළිබඳ පැහැදිලි දත්ත හමු වන්නේ 1881 ජනසංගණනයට අනුවය. එහෙත් ඒ වන විටත් ජාතීන්ගේ නූතන ස්වරූපයන් හැඩගැසෙමින් තිබිණි. නිදසුනක් ලෙස සිංහලයන් උඩරට, පහතරට ලෙස ප්‍රවර්ග දෙකක් ලෙස සැලකීමේ ප්‍රවණතාවක් සිංහලයන් තුළම පැවතිණි.

කෙසේ වෙතත්, සංගණනයට අනුව 1881දී සිංහලයන්ගේ

ප්‍රතිශතය 66.91%කි. 2012 සංගණනය වනවිට මෙම ප්‍රතිශතය 74.88% කි. ශ්‍රී ලාංකික මුස්ලිමුන්ගේ ප්‍රතිශතය 1881 දී 6.69% කි. 2012 දී එම ප්‍රතිශතය 9.23% කි. 1881 දී ශ්‍රී ලාංකික දෙමළ ප්‍රතිශතය 24.90% කි. එය 2012 වන විට 11.21% ක් වී තිබේ.

ඉහත සංඛ්‍යාලේඛන අනුව බලන කල ඉතා පැහැදිලිවම සිංහල ජනගහණයේ ප්‍රතිශතය වැඩි වී තිබේ. වෙනත් ජාතීන් සිංහල ලෙස ස්වීකරණය වීමට වැඩි නිදහසක් ලැබේ නම් තත්වය තවත් වෙනස් වන්නට පුළුවන.

ආගම් අනුව ගත්තත් 1881දී 61.53% ක් වූ බෞද්ධ ප්‍රතිශතය 2012 වනවිට 70.19% ක් දක්වා වැඩි වී තිබේ. මෙය 8.66% ක වර්ධනයකි. 1881 දී 7.10% ක් වූ ඉස්ලාමිකයින්ගේ ප්‍රතිශතය 2012 වන විට 9.71% කි. මේ අනුව 2.61% ක වර්ධනයක් දක්නට ඇත. 1881 දී 21.51% ක් වූ හින්දු ප්‍රතිශතය 2012 වන විට 12.61% දක්වා අඩු වී තිබුණි. මෙය 8.90% ක අඩු වීමකි.

සිංහලයන් අතර සිය ජාතිය සම්බන්ධයෙන් භීතියක් ඇති කරන්නට උපයෝගී කර ගන්නේ මේ සංඛ්‍යා ලේඛනයි.

එහෙත්, අප සිතන පරිදි යම් ජාතියක් වඩා දියුණු තත්වයකට පත් වන විට නිරායාසයෙන්ම ජනගහන පාලනයක් ඇති වෙයි. අධික ජනගහනයක් ඇති සමාජ කණ්ඩායම් අතර දිළිඳුකම ද අධිකය.

සිංහලයන්ට තම ජනගහනය වැඩි කරගන්නට අවශ්‍ය නම් බොහෝ ආයතන වල මුල් පුටු හොබ වන සිංහල ජාතිවාදීන්ට තම ආයතන වල සේවය කරන කාන්තාවන් ප්‍රසූත නිවාඩු ලබා ගැනීම පිළිබඳව සුබවාදී

ඇසකින් බැලිය යුතුය. නමුත් අද සිදු වන්නේ කුමක්ද?

වැඩිම කාන්තා ප්‍රතිශතයක් සහිත රජයේ වෘත්තීය ශ්‍රේණියක් වන හෙද සේවාවේ ප්‍රසූත නිවාඩු ලබා ගන්නා අයට දඬුවම් මාරු දෙන ක්‍රමයක් තිබේ. මගේ මිතුරෙකුගේ බිරිය හෙදියකි. ඔවුන්ගේ දරු දෙදෙනා වෙනුවෙන් ලබා ගත් ප්‍රසූත නිවාඩු අවසන් වී සේවයට පැමිණි අවස්ථා දෙකේම ඇය අභ්‍යන්තරිකව වඩා දුෂ්කර ස්ථාන වලට මාරු කරන ලදී.

කාන්තා ප්‍රතිශතය වැඩි තවත් රැකියාවක් වන ගුරු වෘත්තියේ විදුහල්පති ප්‍රතිශතය තුළ පිරිමින් ඉහළය. මගේ නිරීක්ෂණයට අනුව දරුවන් ලැබීම වැඩියෙන්ම අධෛර්ය කරන ක්ෂේත්‍රයක් වන්නේ ගුරු වෘත්තියයි. රැකියා කරන කාන්තාවක් ප්‍රසූත නිවාඩු ලබා ගැනීම වරදක් සේ සලකන තත්වයක් මුළු සමාජය තුළම පවතී.

සිංහලයන්ට මුස්ලිමුන් සමග තරඟයට දරුවන් හදමින් ජනගහනය වර්ධනය කරගන්නට අවශ්‍ය නම් එය

පටන් ගත යුත්තේ දිළිඳුකම පැටව් ගහන සමාජ ස්ථර වලින් නොවේ. ඉහළ ධනවත් සමාජයෙනි.

සහෝදර සහෝදරියන් හය දෙනෙකුගෙන් යුත් පවුලකින් පැවත එන, ජාතික උරුමය සඳහා කථා කරන, එක්තරා දේශපාලන පක්ෂයක නායකුට සිටින්නේ දරුවන් දෙදෙනෙකු පමණි.

එම පක්ෂයේම තවත් නායකුට පවුල හා දරුවන් කෙතරම් නොවැදගත්ද යත් ඔහුගේ නිල වෙබ් අඩවියේ ඒ ගැන කිසි

තොරතුරක් නැත. පවුල යනු හිස් පිටුවකි.

අපේ හාමුදුරුවරුන්ට නම් නිල වශයෙන් දරුවන් ඇත්තේම නැත.

මෙහෙම ජාතිය හදන්නට බැරිය. මුස්ලිමුන්ට බය නම් ෆුල්ටයිම් වැඩේට බැසිය යුතුය.

එසේ නොකර ජාතිවාදී බියක් සිංහලයන් අතර පතුරුවමින් සිටින්නේ කපටීන් පිරිසක් බව අවධාරණය කළ යුතුය.

මුස්ලිම් හීතිකාව

සිංහලුන්ට විශේෂයෙන්ම සිංහල බෞද්ධයින්ට මුස්ලිම් වරුන් කෙරෙහි එක්තරා ආකාරයක පදනම් විරහිත බියක් ආරෝපණය කර තිබේ. සමහරුන් එය වෛරයක් කර ගන්නා අතර සමහරුන්ට එය කනස්සල්ලකි. ඊට සමගාමීව පොදුවේ මුස්ලිම්වරුන්ටද සිංහලුන් කෙරෙහි බියක් සැකයක් ඇති බව පෙනේ. මුස්ලිම් බිය යනු මේ අන්‍යෝන්‍ය බියයි. මේ අතර කිසිම බියක් සැකක් නැති සිංහලුන් මෙන්ම මුස්ලිම්වරුන්ද නැතුවා නොවේ. මුස්ලිම් බියට හේතුව සිතා මතා

හෝ නොසිතා හෝ මුස්ලිම්වරුන් විසින් කර ගෙන යනු ලබන සංස්කෘතික ආක්‍රමණයක් යැයි සිංහල ප්‍රජාව සිතන්නට පටන් ගෙන තිබේ. පසුගිය වසර පහළොවක් විස්සක් පමණ කාලයේ සිට මුස්ලිම්වරුන් ජන වර්ගයක් ලෙසට පොදුවේ කරන කටයුතු හරහා සිංහලුන්ගේ සංස්කෘතික අවකාශය ආක්‍රමණය කරමින් සිටිතියි ඔවුන්ගෙන් කොටසක් සිතන්නට පටන් ගෙන තිබේ. ඔවුන් මේ සඳහා උදාහරණ ලෙස දක්වන්නේ හලාල්

ප්‍රශ්නය, බොදු බිම් ආක්‍රමණය, අනවසර පල්ලි ඉදිකිරීම් ආදියයි. මෙම කරුණු කිසිවක් සත්‍යය පදනම් කර ගත් ඒවා නොවේ. මුස්ලිම් බිය අනියත පදනම් විරහිත හුඹස් බියකි. මුස්ලිම් සංස්කෘතියට මෙරට සිංහල බෞද්ධ සංස්කෘතිය බිම දැමීමට කිසිම ආකාරයක අරමුණක් නොමැත. අපගේ මතය වන්නේ සිංහල බෞද්ධ සංස්කෘතිය වැටෙන්නේ, අදටත් වැටෙමින් පවතින්නේ සිංහල ප්‍රජාව බටහිර ගරා වැටුණු සදාචාර විරෝධී සංස්කෘතිය අනුකරණය කරමින්

බෞද්ධයින් වෙන්නට උත්සාහ කරන නිසාවෙනි.

මීට දශක තුනකට පමණ ඉහතදීවත් මෙරට මුස්ලිම් බියක් නොතිබිණි. එකල වෙසක් කාලයට බෞද්ධයින්ගේ තොරණ් වල ඇසුනේ මොහිදීන් බෙග් ගේ ගීතය. ඔහු බෞද්ධයෙකු නොවන වග බෞද්ධයින්ට වැදගත් නොවිණි. ඔහු බෞද්ධයෙකු නොවීම ඔහුටද වැදගත් නොවුණා විය යුතුය. එවැනි වතාවරණයක් මෙරට යළිත් ඇති කර ගත හැකිය. සිංහලුන් නිදහස් චින්තනයක් ගොඩනගා ගන්නා

තුරු මෙරට ජාතීන් අතර සංහිඳියාවක් ඇති කිරීම ඉතාම දුෂ්කර ක්‍රියාවක් වනු ඇත. මෙරට ජාතීන් අතර සංහිඳියාවක් ඇති නොවෙනතුරු ජාතියක් වශයෙන් ශ්‍රී ලාංකික කිසිවෙකුටත් ඉදිරි ගමනක් නොමැත.

සිංහල ජනගහනය පිළිබඳ මුස්ලිම් ජනයාගේ මතය

ආගමික හා වාර්ගික අන්තවාදීන් විසින් මවාපාන්නට උත්සාහ දරන මුස්ලිම් භීතිකාව සනාථ කරන්නට ඉදිරිපත්

කරන අභූත චෝදනා කෙසේ වෙතත් සත්‍යය වශයෙන්ම සිංහල ජනගහනය පිළිබඳ ප්‍රශ්නයක් ඇති විය හැකි බව අපි අවංකවම පිළිගන්නෙමු. පහතින් උපුටා දක්වා ඇති පුවත්පත් වාර්තාවන් දෙස ඔබගේ අවධානය යොමු කර එමගින් ඇති විය හැකි සමාජ ව්‍යසනයන් පිළිබඳව කරුණාකර සිතා බලන්න.

1. 2013 අගෝස්තු 16 වැනි සිකුරාදා 'මව්බිම' පුවත්පතේ පහත සඳහන් ප්‍රවෘත්තිය වාර්තා කොට තිබුණි.

## ‘ලංකාවේ දිනකට 1,40,000 ක් අනාචාරයේ හැසිරෙනවා’

## ‘සමලිංගිකයින් 10% කින් වැඩිවෙලා’

## ‘සමීක්ෂණයකින් හෙළි වෙයි’

“ශ්‍රී ලංකාවේ දිනකට පුද්ගලයන් එක්ලක්ෂ හතළිස් දහසක් අභිසරුලියන් සමඟ සහ අනියම් සබඳතා මත අනාරක්ෂිත ලිංගික සබඳතා වල යෙදෙන බව සමීක්ෂණයක දී හෙළි වී තිබේ. ලිංගාශ්‍රිත රෝග සහ ඒඩ්ස් මර්දන ව්‍යාපාරයේ අධ්‍යක්ෂක වෛද්‍ය සිසිර ලියනගේ මහතා සඳහන්

කළේ රාජ්‍ය නොවන සංවිධාන වල සහය මත කරන ලද සමාජ සමීක්ෂණයක දී මේ බව හෙළි වී ඇති බවය”.

මෙම වාර්තාව අනුව දරුවන් බිහි කිරීමේ කාර්යයට බාධක දෙකක් පැහැදිලිව දක්නට ඇත. අනාචාරයේ හැසිරෙන්නන් මාතෘත්වය හෝ පීතෘත්වය පිළිබඳ හැඟීමකින් කටයුතු කරන්නන් නොවන බවයි. ඔවුන් පැහැදිලිවම සදාචාර විරෝධීව තමන්ගේ ලිංගික ප්‍රේරණය සමථයකට පත් කර ගන්නට කටයුතු කරන්නන් හා කරන්නියන් පමණි. බොහෝ

විට මෙහි මුලයම අපේක්ෂාවන් තිබිය හැක. අනෙක් බාධාව සමලිංගිකයින්ගේ වැඩි වීමය. මෙම පිරිසද ජනගහන වර්ධනයට කිසිසේත්ම දායක වන්නන් නොවේ. මෙම කරුණු දෙක සම්බන්ධව වැඩි සහභාගිත්වයක් ඇත්තේ මුස්ලිම් වරුන්ගෙන් ද සිංහල ජනයාගෙන් ද යන්න පිළිබදව කරුණාකර සිතා බලන්න. මෙය සිංහල ජනගහන වර්ධනයට බාධාවක් බව පවසන අතරතුර මේ පිළිබඳව කඩිනම් විසඳුම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස සිංහල

ප්‍රජා නායකයින්ගෙන් ඉල්ලා සිටින්නට කැමැත්තෙමු.

2. 2012 ජූනි මස 17 දින ‘ලංකාදීප’ පුවත්පතේ පළ වූ සවිස්තරාත්මක වාර්තාව කෙරෙහි ද අපගේ අවධානය යොමු කරමු.

“කැලණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ ආචාර්ය වසන්තා සුබසිංහ විසින් ගබ්සාව පිළිබඳව සිදු කරන ලද පර්යේෂණයන් හි දත්ත පදනම් කොට ගෙන මෙම ලිපිය සැකසේ. නිල නොලත් වාර්තා වලට අනුව දිනකට 800-

1000 ත් අතර ප්‍රමාණයක් නීති විරෝධී ගබ්සා සිදු වේ. ගබ්සාව පිළිබඳව පළමු පර්යේෂණය සිදු කරන ලද්දේ 1998 දීය. එයින් හෙළිදරව් වූ කරුණක් නම්, ලංකාවේ වසරකට සිදු වන දරු උපත් ප්‍රමාණය 3,75,000කට ආසන්න වන බවයි. නමුත් ලක්‍ෂ තුන ඉක්මවා ප්‍රමාණයක් ගබ්සා සිදු වීම බරපතළ අර්බුදයක් බවට පත්ව ඇත. ගණනය කිරීම මගින් දක්නට ලැබෙන ප්‍රශ්නය මෙය වුවත් මින් එහා ගිය සමාජ ප්‍රශ්න රැසක් නීති විරෝධී ගබ්සාව නිසා දැකිය හැකිය”.

ඉහත වාර්තාව අපට හඬ නගා පවසන්නේ කුමක් ද? මෙරට ගබ්සා මධ්‍යස්ථාන අති විශාල ප්‍රමාණයක් ඇති බව නිතර මාධ්‍යයන් මගින් දකින්නෙමු. මෙම ගබ්සා මධ්‍යස්ථානයන්ට මුස්ලිම් වරුන් යන්නේ නැති බව අපි දනිමු. ජනගහනය පිළිබඳව අන් අයට අසත්‍ය චෝදනා කරමින් සිටිනවාට වඩා ගබ්සා මධ්‍යස්ථාන වල දිනකට විනාශ කර දමන අති විශාල ජීවිත සංඛ්‍යාව බේරා ගැනීමට කාරුණිකව ඉදිරිපත් වන්න.

කැලණිය විශ්ව විද්‍යාලය මගින් පවත් වන ලද සමීක්ෂණයේ

අඩංගු තොරතුරු අනුව හෙළිදරව් වන කරුණු අති භයානකය. සමස්ත වාර්ෂික දරු උත්පත්තිය 375,000 ක් වන අතර වාර්ෂික ගබ්සා සිදු වන ප්‍රමාණය 300,000 ඉක්මවන බව සඳහන් කිරීමෙන් අප සමාජය ඉදිරියේදී මුහුණ පෑ හැකි ගැටලු කිහිපයක් ඇත. මෙම නීති විරෝධී ගබ්සා මධ්‍යස්ථානයන්ගෙන් සේවා ලබා ගන්නට යන මුස්ලිම් වරුන්ගේ සංඛ්‍යාව ඉතාම අල්පය, නැතහොත් කිසිවෙකුත් නොයන්නේයැයි පැවසීමද නිවැරදිය. සිංහල ජනගහනයේ

වෙනසක් වීමට මෙම ගබ්සා මධ්‍යස්ථාන කෙතෙක් දුරට ඉවහල් වන්නේද යන්න පිළිබඳව මුස්ලිම් වරුන්ට චෝදනා නගන සංවිධාන කුමක් කර ඇත්දැයි අසන්නට කැමැත්තෙමු. ගබ්සාව මිනිස් ඝාතනයකි. මෙම ලිපියේ මීළඟට උපන් හැටියේ සිදු කරනු ලබන බිළිඳු ඝාතන පිළිබඳ ශ්‍රී ජයවර්ධන විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ මහාචාර්ය මයුර සමරකෝන් මහතාගේ අදහස් උපුටා දක්වා ඇත්තෙමු. ගව ඝාතන නතර කරන්නැයි ජීවිත පුදති. තවත් පිරිසක් ජීවිත

පුදන්නට සූදානමින් සිටිති. මහ පොළොව කම්පා කරවන තරම් සිදු වන මෙවන් හා අනෙකුත් මිනිස් ඝාතන පිළිබඳව මෙම පිරිස් මුනිවත රකිති.

උපන් විගස දරුවන් මරා දැමීම

ගබ්සාවට වඩා භයානක සමාජ පිළිලයක් බවට පත් ව ඇත්තේ උපන් හැටියේ බිළින්දන් මරා දැමීමේ කෲර ක්‍රියාවයි. මෙම සමාජ ප්‍රශ්නය පිළිබඳව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ මහාචාර්ය මයුර සමරකෝන් මහතා සමග ‘අද’ පුවත්පතේ

පාලිත ආරියවංශ මහතා විසින් පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවේ වාර්තාව 2013 ඔක්තෝම්බර් මස 29 වැනි දින ‘උපන් හැටියේ දරුවන් මරා දමන්නේ ඇයි’ යන මාතෘකාව යටතේ එම පුවත්පතේ පළ කොට තිබිණි. එම වාර්තාවෙන් උපුටා ගත් කොටස් පහතින් දක්වා ඇත්තෙමු.

‘ලෝක ළමා දිනය සමරන්න මුළු රටම සූදානම් වී සිටියදී ඊට දින තුනකට පෙර බදුලු වැසියන්ට දක්නට ලැබුණේ ඉතා දුක්බර දසුනකි. බදුල්ල දුම්රිය ස්ථානයට නුදුරින් පිහිටි ගුවන්

පාලමේ පඩියක් මත තිබුණේ මළ සිරුරකි. මේ කිරිකැටියා රෙදි කඩකින් ඔතා තිබුණේය. හිමිදිරි පාන්දරම මේ ඛේදජනක දසුන දැක තිබුණේ මෙම පාලම මතින් ගමන් කළ ගම් වැසියෙකි. බිළිඳු සිරුර පිරිමි දරුවෙකුගේය. බදුල්ල පොලිසියට ලැබුණු දුරකථන පණිවිඩයක් අනුව බදුල්ල පොලිසිය පරීක්ෂණ ආරම්භ කළහ.

බදුල්ල මහේස්ත්‍රාත් වරිය එම ස්ථානයට පැමිණ බිළිඳු මළ සිරුර පරීක්ෂා කර එය පශ්චාත් මරණ පරීක්ෂණයකට

ළක් කරවීමටත් වැඩිදුර පරීක්ෂණ පවත්වා සැකකාරිය අත්අඩංගුවට ගැනීමටත් නියෝග කළාය. එම නියෝගය ලැබී පැය කිහිපයක් ගත වෙද්දී බදුල්ල පොලිසියට තවත් තොරතුරක් ලැබුණේය. ඒ හාලිඇල ක්වීන්ස් ටවුන් වත්තේ ගැබිනියක් ව සිටි කාන්තාවක් පිළිබඳවය. එම සැකකාරිය අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමේදී අනාවරණය වුයේ වෙනත් බිළිඳු විපතක් ගැනය. අවිවාහක කාන්තාවක් වූ ඇය බිහි කළ දරුවා උපන් හැටියේ වළ දමා තිබිණි. උපන් හැටියේ

බිළිඳා ඝාතනය කර හෝ නොකර ගෝනි කැබැල්ලක ඔතා වළ දමා තිබුණේ ඇගේ නිවසේ මුළුතැන් ගේ ආසන්නයේ පිහිටි කෙසෙල් පඳුරක් යටය.

උපන් හැටියේ දරුවන් ඝාතනය කරන සිද්ධීන් පසුගිය කාලය පුරා දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් අසන්නට ලැබිණ. අම්මලා තම කුසින්ම බිහි කළ දරුවන් මෙසේ ඝාතනය කරන්නේ ඇයිදැයි යන ප්‍රශ්නයට විසඳුම් සොයා දීම අද දවසේ සමාජ වගකීමකි. අපි මේ පිළිබඳව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ

# සමාජ විද්‍යාව පිළිබඳ මහාචාර්ය මයුර සමරකෝන් මහතාගෙන් විමසුවෙමු.

“වර්තමාන සමාජයේ අද තිබෙන ප්‍රධානතම ප්‍රශ්නය තමයි විවාහ සංස්ථාව බලවත් අර්බුදයකට ලක් වී තිබීම. ඒකට සමාජ විද්‍යාත්මකව ප්‍රධාන හේතු කිහිපයක් බලපානවා. විවාහයට අද ලැබිල තියෙන්නෙ ආර්ථික වටිනාකමක්. මේ නිසා විවාහ වීමේ වයස් සීමාව ක්‍රමයෙන් කල් යමින් තිබෙනවා. වර්තමානයේ සමාජය තුළ විවාහ වීමේ සීමා පිරිමියෙකුගේ අවුරුදු 31 – 33 දක්වාත්

කාන්තාවකගේ විවාහ වයස් සීමාව අවුරුදු 31 – 32 දක්වා වූ කාල පරාසයකටත් ගමන් කරලා තියෙනවා. නමුත් විවිධ හේතුන් නිසා විවාහයට ඇතුළත් වීම ප්‍රමාද වීම අනියම් ආකාරයකට සමාජයේ වෙනත් ගැටලු වලට හේතු වෙලා තියෙනවා. උදාහරණයක් ගත්තොත් විවාහ වීමේ වයස් සීමා කල් යන්නේ අධ්‍යාපන හා ආර්ථික හේතු මත. නමුත් පුද්ගලයෙකුගේ කායික හා ලිංගික අවශ්‍යතා කල් දාන්න බැහැ. මෙහි අනියම් ප්‍රතිඵලය වෙලා තියෙන්නෙ අද සමාජය

තුළ අනියම් ලිංගික සම්බන්ධතා වැඩිවෙලා තියෙනවා. මෙන්න මේ හේතුව කරණ කොට ගෙන බොහෝ අවස්ථා වල මෙවැනි බේදවාචකයන්ට සමාජය ලක් වන බව පැහැදිලිවම පේනවා.”

ඉහතින් උපුටා දැක්වූයේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ මහාචාර්ය මයුර සමරකෝන් මහතා සමග ‘අද’ පුවත්පතේ පාලිත ආරියවංශ මහතා විසින් පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව 2013 ඔක්තෝම්බර් මස 29 වැනි දින ‘උපන් හැටියේ

දරුවන් මරා දමන්නේ ඇයි’ යන මාතෘකාව යටතේ එම පුවත්පතේ පළ කොට තිබුණු වාර්තාවෙන් කොටසකි.  උපන් හැටියේ දරුවන් මරා දැමීමේ සංස්කෘතිය ක්‍රමයෙන් වර්ධනය වෙමින් පවතින බව මෙම ලිපියේ අඩංගු කරුණු වලින් පැහැදිලිව පෙනෙන්නට ඇති සාධකයකි. මෙය අති සාහසික කෲර ක්‍රියාවකි. මෙම අති පිළිකුල් සහගත ක්‍රියාව සිංහල ජනගහන වර්ධනය කෙරෙහි බලපාන අයුරු පිළිබඳව  විමර්ශනය කර බැලීමේ අවශ්‍යතාව මතු වී ඇත.

මෙවන් කරුණු වළක්වාගත හැකි නම් එය මුස්ලිම් වරුන්ට ඇඟිල්ල දිගු නොකර තමන්ගේ වාර්ගිකත්වයේ වර්ධනය ඉහළ නංවා ගැනීවට සිංහල ප්‍රජාවට හැකි වනු ඇත.

මෙම ලිපිය අනුව විවාහ වීමේ වයස 31 ඉක්ම වන බව සඳහන් වී තිබේ. මෙය ද වැඩියෙන් දරුවන් ලැබීමට බාධාවක් ලෙස අපි දකින්නෙමු. විවාහ වීමේ වයස ඉහළ යන විට සමාජයේ සදාචාර ප්‍රශ්න මතු වීමට ද ඉඩ ඇති බව මෙම ලිපිය විග්‍රහ කරයි. වයස 25 ඉක්මවන්නට පෙර විවාහ බන්ධනයට

ඇතුළත් වීමට දිරි ගැන්වුවහොත් අඩු ජනගහන ප්‍රශ්නයට මෙන්ම සදාචාර ප්‍රශ්නයට ද එය විසඳුමක් වනු ඇත.

3. මුස්ලිම් ජනගහනයෙන් සම්පූර්ණ රජයේ සේවයේ සිටින්නේ 1.5% කට වඩා අඩු පිරිසකි. ස්වාමි පුරුෂයා හා බිරිය යන දෙදෙනාම රජයේ සේවයේ සිටින්නේ ඉතාම අල්ප පිරිසකි. සිංහල ජනයාගෙන් අති මහත් බහුතරයක් රජයේ සේවයේ සිටිති. එයින් ස්වාමි පුරුෂයා හා බිරිය යන දෙදෙනාම රජයේ සේවයේ

සිටින පිරිස ඉතාමත් අධිකය. දෙදෙනාම රජයේ සේවයේ නිසා ඔවුන්ට දරුවන් ලබා ඔවුන් නඩත්තු කිරීමේ කාර්යය ඉතාමත් දුෂ්කර එකක් බවට පත් වී ඇත. පොලිසියේ හා හමුදාවේ සේවය කරන්නන්ට දරුවන් ලැබූ විට දෙන දීමනාව සෑම රජයේ සේවකයෙකුටම ලබා දෙන්නට කටයුතු කරන්න. රජය මගින් දිවා ළමා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවා දරුවන් බලා ගැනීමේ කාර්ය පහසු කරන්නට කටයුතු කරන්න. මෙම යෝජනා ක්‍රියාත්මක කිරීම තුළින් රජයේ

සේවකයින්ට දරුවන් වැඩි වැඩියෙන් ලබා ගැනීම පහසු කළ හැකි වනු ඇත. ප්‍රශ්නය තමන් වෙතම තබා ගනිමින් 2032 ලංකාවේ මුස්ලිම් ජනගහනය 51% බවට පත් වන බව මුසාවාද ඉදිරිපත් නොකොට සත්‍යවාදීව හා කාරුණිකව කටයුතු කරන මෙන් ඉල්ලා සිටින්නට කැමැත්තෙමු.

4. ‘පුංචි පවුල රත්තරන්’ යනුවෙන් ලංකාවේ පවුල් සැලසුම් ව්‍යාපාරය 1950 ස් ගණන් වල ආරම්භ වූ අතර එහි ව්‍යාප්තිය විශේෂයෙන්ම අසූව

දශකයේ දක්නට ලැබුණි. බෞද්ධ ජනගහන වර්ධන වේගය තරමක් දුරට අඩු වීමට මෙම සාධකය බලපා ඇති බව පෙනෙන්නට ඇත. 1953 දී පවුල් සැලසුම් සංගමය (Family Planning Association) පිහිටු වීම ලංකාවේ පවුල් සැලසුම් ක්‍රියාමාර්ගයේ ප්‍රධාන මංසන්ධියක් ලෙස සැලකිය හැක. ලංකා රජය විසින් මෙම සංගමයේ ක්‍රියා මාර්ගයට අනුබල දීමක් ලෙස 1954 සිට වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කරන ලදී. 1958 සහ 1965 කාලය අතරතුර පවුල් සැලසුම්

ක්‍රියාවලිය ක්‍රමක්‍රමයෙන් ව්‍යාප්ත විය. 1955 වර්ෂයේදී පවුල් පාලනය ජාතික ව්‍යාපාරයක් ලෙස සෞඛ්‍ය අමාත්‍යංශයට එකාබද්ධ විය. 1965 සහ 1975 කාලය තුළ, ස්වීඩනයෙන් ලැබුණ ආධාරත් සමගින් පවුල් සැලසුම් වැඩපිළිවෙළ තවදුරටත් වර්ධනය විය. 1975න් පසුව මෙම ව්‍යාපාරය තව තවත් ව්‍යාප්ත වූ අතර ජනතාව පවුල් සැලසුම් පිළිබඳව දැනුවත් කිරීම ඇතුළු විවිධ වැඩසටහන්ද අරම්භ විය. මුස්ලිම් ජනගහන බිල්ලා එනවායයි ජනයා බියවද්දන

පිරිස සඳහන් කරන ප්‍රධාන කරුණ වන්නේ පවුල් සැලසුම් හමුවේ සිංහල ජනතාව අතර ජනගහන වර්ධනය අඩු වන බවත්, මුස්ලිම් ජනතාව අතර එසේ නොවන බවත්ය. එම කරුණ නිකම්ම නිකම් ප්‍රකාශනයකට පමණක් සීමා වන අතර ඔවුන් ඉදිරිපත් කරන දත්තයක් නැත. ඉස්ලාමයට අනුව පවුල් සැලසුම තහනම් නොවේ. ගැබ් ගැනීම් වැළැක්වීමට භාවිත කරන ක්‍රම, කාණ්ඩ දෙකකට බෙදිය හැක: ස්ථිර ලෙස නිසරු කිරීම සහ තාවකාලික ලෙස ගැබ් ගැනීම

වැළැක්වීම. ඉස්ලාම් දහමට අනුව තහනම් වන්නේ පළමු කාණ්ඩයට අයත් පවුල් සැලසුම් ක්‍රමයන් පමණක්ය. පවුල් සැලසුම් ව්‍යාපෘතීන් හි ප්‍රතිඵල පිළිබඳ අපූරු මාධ්‍ය වාර්තාවක් 2014 අප්‍රයෙල් 30 වැනි දින ‘අද’ පුවත්පතේ මුල් පිටුවේ ප්‍රධාන ශීර්ෂ පාඨය ලෙස පළ කොට තිබුණි. එම වාර්තාව පහතින් උපුටා දක්වා ඇත්තෙමු.

“වසර 10 කදී කාන්තාවන් 890,000 ක් වඳ භාවයට”

“බොදුබල සේනා සංවිධාන ජාලය”

“ලෝක ජනගහනය පාලනය කිරීම් සඳහා ශ්‍රී ලංකාවේ පවුල් සංස්ථාව තුළ දරුවන් දෙදෙනෙකුට සීමා කිරීමට 1973 වසරේදී මහා බ්‍රිතාන්‍යයේ සංවිධානයක් වන ‘මාරි ස්ටොප්’ සංවිධානය ශ්‍රී ලංකාව තුළ සිදු කළ වැඩ පිළිවෙළට මුවා වී මෙරට තුළ ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධානයක් විසින් ගෙවී ගිය වසර 10 ක කාලය තුළ මේ රටේ කාන්තාවන් අට ලක්ෂ අනුදහසකට අධික පිරිසක් වඳ භාවයට පත් කර තිබෙන බව බොදුබල සේනා සංවිධාන

ජාලය සඳහන් කරයි. 'පුංචි පවුල රත්තරන්' යන තේමාව යටතේ 1973 වසරේදී මෙරට තුළ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ බවත් එම වැඩ පිළිවෙළ එම කාලය තුළ අවසන් වුවත් එහි නම වෙනස් කර යම්කිසි සංවිධානාත්මක පිරිසක් මෙරට කාන්තාවන් වඳ භාවයට ලක් කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරමින් තිබෙන බවත් එම සංවිධාන ජාලයේ මහලේකම් ගලගොඩඅත්තේ ඥානසාර හිමියෝ අවධාරණය කළහ. මෙලෙස කාන්තාවන් වඳභාවයට පත් කිරීමේ

කටයුත්තට යම් යම් වෛද්‍යවරුන් පවා සහයෝගය ලබා දී තිබෙන බවත්, මීට අමතරව පවුල් සෞඛ්‍ය නිලධාරිනියන් හරහාද මෙම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර තිබෙන බවත් උන්වහන්සේ සඳහන් කර සිටියහ. මෙලෙස වඳ භාවයට අවශ්‍ය කටයුතු කර ගන්නා සෑම කාන්තාවකටම මෙම රාජ්‍ය නොවන ආයතනය විසින් රුපියල් 500 ක මුදලක් ලබා දී තිබෙන බව ද උන්වහන්සේ අවධාරණය කළහ”.

මෙම ව්‍යාපෘති මුස්ලිම්
වරුන්ගේ කුමන්ත්‍රණයක
ප්‍රතිඵලයක් යැයි සඳහන්
නොකිරීම ගැන අප
උන්වහන්සේට ස්තුති කළ යුතු
වන්නෙමු. සිංහල ජාතියට ඇති
තර්ජනය මෙවන් ප්‍රවෘත්ති
මගින් පැහැදිලි වනු ඇතැයි
විශ්වාස කරන්නෙමු. මෙම වඳ
සැත්කම් කර ගන්නා
පිරිසගෙන් බහුතරය සිංහල
කාන්තාවන් වන අතර ස්ථිර වඳ
සැත්කම් කර ගැනීම ඉස්ලාමීය
නීතිය අනුව තහනම් හෙයින්
නොදැනුවත්කමින් මිස මුස්ලිම්
කාන්තාවන් මෙම කටයුත්තට

ඉදිරිපත් නොවෙති. රුපියල් 500 ක් වැනි අල්ප මුදලකට ජාතියේ අනාගතය අප විකුණා දමන්නේ නම් සිංහල ජනගහන ප්‍රශ්නය සම්බන්ධයෙන් මුස්ලිම් වරුන්ට ඇඟිල්ල දිගු කිරීමේ අර්ථයක් තිබේ ද කියා අසන්නට කැමැත්තෙමු.

5. 2014 මාර්තු 14 වැනි දින ‘මව්බිම’ පුවත් පතේ පළ වූ වාර්තාවක් කෙරෙහි ද ඔබගේ අවධානය යොමු කරවන්නට කැමැත්තෙමු.

“මත්ද්‍රව්‍ය භාවිතයෙන් දිනකට 360 ක් මරුට”

"ලංකාවේ දිනකට 1200 ක් උපදිනවා - දිනකට 1000 ක් මැරෙනවා"

"ඒ දාහෙන් 600 ක් මැරෙන්නේ බෝ නොවන රෝගවලින්"

"ඒ 600 න් 360 ක් මැරෙන්නේ මත්ද්‍රව්‍ය භාවිතය නිසා වැළඳෙන රෝග වලින්"

"සෞඛ්‍ය ඇමති මෛත්‍රීපාල හෙළි කරයි."

මත්ද්‍රව්‍ය භාවිතය මුස්ලිම් ජනයා අතර නොමැත්තේයැ'යි පවසන්නට තරම් අතාත්වික වන්නට කිසිවෙකුට නොහැක.

නමුත් මත්ද්‍රව්‍ය භාවිතය මුස්ලිම් ජනයා අතර ඇත්තේ ඉතාම අවම මට්ටමකින් බව වගකීමකින් යුක්තව පවසන්නට කැමැත්තෙමු. දිනකට මේ හේතුවෙන් මිය යන සංඛ්‍යාව අතර බහුතරය කවුරුන්දැයි අමුතුවෙන් අටුවා ලියන්නට අවශ්‍ය නොවේ.

මෙම සියලු කරුණු කෙරෙහි සාවධාන ව විමසුමක යෙදී සෑම සමාජ ප්‍රශ්නයකටම මුස්ලිම් ප්‍රජාව දෙසට ඇඟිල්ල දිගු නොකොට කරුණාකර තමන් දෙසට හැරී ගත යුතු නිවැරදි ක්‍රියාවන් ගැනීමට අපගේ

හිතවත් සහෝදර සිංහල ප්‍රජාවගෙන් ඉල්ලා සිටින්නට කැමැත්තෙමු. සියලු සමාජ ප්‍රශ්න අවබෝධ කර ගෙන ඒවාට නිසි පිළියම් යොදා ශක්ති සම්පන්න ශ්‍රී ලංකාවක් ගොඩ නගන්නට ලක් මවගේ සියලු දරුවන් එකට අත්වැල් බැඳ ගනිමු.